
E M P O W E R

සියළු අතින්
කාර්යක්ෂමව

ජනහිතකාමී
අපගේ මෙහෙයුම්

ප්‍රජාවට
සුභසාධනය

ඔබට සහ රටට
විශ්වාසදායී




උපරිමය
ලබාදීම සඳහා
අභිප්‍රේරණය

ජාතියක් ලෙස
වර්ධනය වීමට
අවස්ථාව

ශක්තිමත් හා
ක්‍රියාශීලී
කණ්ඩායම් කාර්ය

# අපි ලෙකෝ

වාර්ෂික වාර්තාව 2013

# අපගේ
# දැක්ම

නවෝත්පාදන පරිසර හිතකාමී ව්‍යාපාරයක් මඟින්
ජනතාවගේ ජීවිතවලට එළිය ලබාදීම

අපගේ

# මෙහෙවර

අඛණ්ඩ නවෝත්පාදනය තුළින් සමාජයට උසස්ම ශක්ති විසඳුම් ලබාදීම

# පටුන


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 05 |
| සභාපතිවරයාගේ පණිවුඩය | 06 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 08 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 09 |
| ආයතනික කළමනාකාරිත්වය/ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 20 - 21 |
| ස්වාධීන විගණන වාර්තාව | 23 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 24 |
| මුළු විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශනය | 25 |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 26 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 27 |
| මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | 29-58 |
| කාර්යසාධන අවධානයන් | 59 |

# අපි

ස්ථායී පර්යේෂණ හා සංවර්ධනය මඟින්
නවීන තාක්ෂණය සමඟ දැය සාරවත් කරන
ස්ථිරසාර නව්‍යකරණීය ආයතනයකි.

# නව්‍යකරණීය වෙමු



# ආයතනික තොරතුරු

**සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

**නෛතික ස්වභාවය**
1983 වර්ෂයේදී සංස්ථාපනය කරන ලද මෙම සමාගම 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන හා 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාගත කර ඇත.

**2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය**

| | |
|---|---|
| එච්.ජී. සාගර කාරියවසම් මහතා | 2013 මාර්තු 08 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.<br>(සභාපති 2013 මාර්තු 08 දින සිට බලපැවැත්වෙන පරිදි) |
| ඩබ්ලිව්.බී. ගනේගල මහතා | 2013 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| ඩබ්ලිව්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා | 2013 ඔක්. 10 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| පී.කේ.ඒ.ඩී. ද සිල්වා මහතා | 2009 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| රොහාන් සෙනෙවිරත්න මහතා | 2010 ජූනි 30 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| ඩී.පී.එස්. ජයවර්ධන මහතා | 2013 මාර්තු 08 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |
| සුදර්මන් ද කොස්තා මහතා | 2013 නොවැ. 13 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී. |

**සමාගම් ලේකම්වරු**
පී.ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්) සමාගම
අංක 3/17, කින්සි පාර, කොළඹ 8

**ලියාපදිංචි කාර්යාලය**
අංක 411, ගාලු පාර
ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල, කොළඹ 3

**විගණකවරු,**
අර්නස්ට් ඇන්ඩ් යන්ග් - වරලත් ගණකාධිකාරීවරු
201, ද සේරම් පෙදෙස, කොළඹ 10

**බැංකුකරුවන්**

ලංකා බැංකුව

ලංකා කොමර්ෂල් බැංකුව පීඑල්සී

හැටන් නැෂනල් බැංකුව පීඑල්සී

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී

මහජන බැංකුව

සම්පත් බැංකුව පීඑල්සී

සෙලාන් බැංකුව පීඑල්සී

ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

සීමාසහිත ජාතික සංවර්ධන බැංකුව

හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් (HSBC)

ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB)

ඩීඑෆ්සීසී වර්ධන බැංකුව පීඑල්සී

සිටි බෑන්ක් එන්.ඒ.

පෑන් ඒෂියා බැන්කින් කොපරේෂන් පීඑල්සී (PABC)

යූනියන් බෑන්ක් පීඑල්සී

# සභාපතිවරයාගේ පණිවුඩය

ලෙකෝ 1983 වර්ෂයේ එහි ආරම්භයේ සිට ශ්‍රී ලංකාවේ ජාතික යටිතල ප්‍රාණනාලිය වෙනුවෙන් ප්‍රධාන භූමිකාව සඳහා සකස් වූ අතර ප්‍රධාන උපයෝගිතා සපයන්නා ලෙස ජාතියට වෙන්වුණු හා කැපවුණු 30 වසරක සේවය ඇගයීම 2013 වර්ෂයේදී සනිටුහන් කරන ලදී. ගනුදෙනුකරුවන්ට විශ්වාසදායී හා ගුණාත්මක සේවාවක් ලබාදීම සඳහා ලෙකෝ ආයතනය සවිබල ගැන්වීමට මූලික වූ අපගේ ආරම්භක ශක්තිමත් පදනමට කෘතගුණ සැලකීම සුළුපටු කරුණක් නම් නොවේ.

ලෙකෝ 30 වැනි වාර්ෂික මහා සභා රැස්වීම් අවස්ථාවේදී අපගේ වටිනා කොටස්කරුවන් පිළිගැනීම හා පසුගිය වර්ෂ 12 ක් සඳහා සිදුකර තිබූ ප්‍රගතිය හා කාර්යසාධනය වාර්තා කිරීම මා ලැබූ විශාලතම වරප්‍රසාදයක් හා සතුටට කාරණයක් වේ.

## මූල්‍ය අවධානයන්

සමාලෝචිත වර්ෂය තුළදී ලංකා විදුලි සමාගමේ සහ එහි පරිපාලිතයන්ගේ සමස්ත කාර්යසාධනය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී කාර්යසාධනයේ වර්ධනය හේතුවෙන් ඉතා සතුටුදායක විය හැක.

සමූහය විසින් උත්පාදනය කරන ලද සමස්ත ආදායම 2012 වර්ෂයේ ශ්‍රී ලංරු. මිලියන 19,761ට සාපේක්ෂව ශ්‍රී ලංරු. මිලියන 22,373 ක් විය. මෙම සංඛ්‍යා 13%ක විකුණුම් වර්ධනයක් නිරූපනය කරන අතර 2012 වර්ෂය තුළදී ශ්‍රී ලංරු. මිලියන 3,793ට සාපේක්ෂව ශ්‍රී ලංරු. මිලියන 5,469 ක් වූ ගැලපීම්වලට පෙර සමස්ත දළ ලාභයක් වාර්තා කිරීමට දායක විය.

කෙටිකාලීන හා දිගුකාලීන තැන්පතුවල ආයෝජනය කරන ලද අතිරේක මුදල් අතිරික්තයෙන් 2013 වර්ෂය තුළදී ලැබුණු පොලී ආදායම ශ්‍රී ලංරු. මිලියන 864 ක් විය.

පරිපාලිත සමාගම්වලින් ලැබුණු ලාභාංශ තුළ සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම - ඇන්ටි මීටර් ගෲප් ඔෆ් චයිනා සමඟ වූ බද්ධ ව්‍යාපාරයෙන් ලැබුණු ශ්‍රී ලංරු. මිලියන 3.4 ක් හා සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමෙන් ලැබුණු ශ්‍රී ලංරු. මිලියන 573 ක් ද ඇතුළත් විය.

ශුද්ධ වත්කම් 2012 වර්ෂයේ ශ්‍රී ලංරු. මිලියන 15,256 සිට වර්ෂය තුළ ශ්‍රී ලංරු. 15,366 දක්වා වර්ධනය වී තිබූ අතර කොටසකට ශුද්ධ වත්කම් 2012 වර්ෂයේ ශ්‍රී ලංරු.133ට සාපේක්ෂව 2013 වර්ෂයේදී ශ්‍රී ලංරු.134.19ක් දක්වා වැඩිවීමක් පෙන්වා තිබුණි.

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නියෝගාත්මක අවශ්‍යතාවයක් වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කරන ලදී. 2013 වර්ෂයේදී මූල්‍ය අංශයේ කැපවුණු කාර්යයන් හේතුවෙන් තවදුරටත් තත්ත්වාගණනය නොකළ විගණන මතයක් අප වෙත ලැබී තිබුණි.



# සභාපතිවරයාගේ පණිවුඩය

## මෙහෙයුම්

සමාලෝචිත වර්ෂය තුළ 507,986 ක් වූ අපගේ මුළු පාරිභෝගික පදනම ශක්තිමත් කිරීමට දායක වෙමින් 1.43% ක පාරිභෝගික වර්ධනයක් ලංකා විදුලි සමාගම විසින් අවශෝෂණය කර ගන්නා ලදී. බෙදාහැරීම් පාඩුව 4.6% ක් වූ අතර එය සමාගම ආරම්භයේ සිට වඩාත් අඩුම වූ සංඛ්‍යාව විය. එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් දී තිබූ අවම සම්මතයට වඩා 1% කින් ද අඩු වේ.

2013 වර්ෂය තුළදී අපගේ පාරිභෝගිකයන්ට ගි.වො.පැ. 1,2210 වැඩි ප්‍රමාණයක් බෙදාහරින ලදී. තවදුරටත් හරිත බල ප්‍රතිපත්තියට අනුකූලව නව ශුද්ධමණු සම්බන්ධතා 218 ක් අප විසින් ලබා දෙන ලදී.

එසේම 2013 දෙසැම්බර් මාසයේදී ඉහළ වෝල්ටීයතා රැහැන් කි.මී. 1,120 ක්, අඩු වෝල්ටීයතා රැහැන් කි.මී. 3,620 ක් බෙදාහැරීම් උප පොළවල් 2,187 ක් හා තොග උප පොළවල් 1,398 ක් මඟින් සම්පූර්ණ කරමින් බෙදාහැරීම් පද්ධති වත්කම් සඳහා ළඟාවී තිබුණි. මුළුමනින්ම ශ්‍රී ලංරු. මිලියන 595,39ක වටිනාකමක් ලෙකෝ බෙදාහැරීම් වත්කම් පද්ධතියට එකතු කරන ලදී.

කොමන්වෙල්ත් රාජ්‍ය ප්‍රධානීන්ගේ රැස්වීම් සංවිධායකයන්ගේ විශේෂ ඉල්ලීමට අනුව, විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් ජනප්‍රිය හික්කඩුව වෙරළ ආලෝකමත් කිරීම සඳහා විදුලි ලාම්පු කණු සවි කිරීමට අමතර වශයෙන් ගාලු කොටු පවුර තුළ නව ආලෝකකරණ පද්ධතියක් සවි කිරීම සඳහා ලෙකෝ විසින් එහි දැනුම හා විශේෂඥතාව සපයන ලදී.

වර්ෂය තුළ ලංකා විදුලි සමාගම විසින් එහි ශාඛාවල විදුලි හානිය පාලනය නියාමනය කිරීමේ පරිශ්‍රමයන් වැඩි කර තවදුරටත් විය හැකි පාඩු වළක්වා ගැනීමට පරිශ්‍රමයන් ගන්නා ලදී.

සමාලෝචිත වර්ෂය තුළ පද්ධති බිඳ වැටීම් සාමන්‍ය කාල දර්ශකය (System Average Interruption Duration Index) 30% ක් ලෙස සැලකිය යුතු අඩුකිරීමක් ඉටුකර ගැනීමට ලංකා විදුලි සමාගමට හැකිවූ බව මම මහත් අභිමානයෙන් ප්‍රකාශ කරමි.

## ඉංජිනේරු සේවා

ලෙකෝ විසින් නව විදේශ ආයෝජන අවස්ථාවන් ගවේෂණය කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇති අතර එසේම තවමත් ඇගයීම් තත්ත්වයේ පවතින තාක්ෂණිකව දියුණු වීථි ආලෝකකරණ පද්ධතිය සංවර්ධනය කිරීමේ කාර්යයේ නියැලී 11 ඇත.

නාගරික ප්‍රදේශවල උඩින් යන විදුලි රැහැන් භූගත කේබල් ජාලයකට හැරවීමට ආරම්භයන් සිදුකර ඇති අතර එය විශ්වාසදායී සැපයීම් වැඩිකිරීම කෙරෙහි හා නාගරික ප්‍රදේශවල දර්ශනය වැඩි කිරීම සඳහා ද හේතු වේ.

විදුලි බලය ජනනය කිරීමේ අංශය වෙනත් අතකට හැරවීමේ ආරම්භයන් අප විසින් ගෙන ඇති අතර කුඩා ජල විදුලිබල හා සූළං විදුලිබල ව්‍යාපෘති ආරම්භ කිරීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා ඇතැම් ප්‍රාථමික පියවරයන් ගෙන ඇත.

## මානව සම්පත් හා පරිපාලනය

සමාලෝචිත වර්ෂය තුළ, සංවිධාන ව්‍යුහයට හා කාර්ය ක්‍රියාවලීන්ට බලපාන නව සංශෝධනයන් කිහිපයක් සිදුකර ඇති අතර ලෙකෝ සේවා ලබාදීමේ කාර්යක්ෂමතාවය හා ගුණාත්මක තත්ත්වය විශාල ලෙස වැඩිවීමට එය හේතුවී ඇත.

එහි කාර්ය මණ්ඩලයේ වැදගත්කම හා වටිනාකම හඳුනාගනිමින් ලෙකෝ කණ්ඩායමේ හැකියාවන් හා ධාරිතාවයන් වර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් ධාරිතා සංවර්ධන වැඩසටහන් කිහිපයක් ලෙකෝ විසින් පවත්වන ලදී. සමූහයේ ආයතනික අරමුණු කරා මෙහෙයවීම පිණිස හොඳින් පුහුණු වූ හා අභිප්‍රේරිත කණ්ඩායමක් ස්ථාපනගත කිරීම තහවුරු කර ගනිමින් සමාගම කැපවීමෙන් හා බැඳීමෙන් ක්‍රියාකරයි.

එම කණ්ඩායමේ සුබසාධනය පිළිබඳ සැලකිලිමත් වීමෙන්, කල් ඉක්මවා තිබූ උසස්වීම් යෝජනා ක්‍රමය 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද අතර, වසර 25කට වැඩි සේවාවක් ඉටුකළ සේවක මණ්ඩලය සඳහා විශේෂ ත්‍යාග ලබාදෙන ලදී.

## ස්තූතිය

ගරු අමාත්‍යතුමාට, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට හා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමාට ඔවුන්ගේ අඛණ්ඩ මාර්ගෝපදේශකත්වය හා සහයෝගය වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කරමි. මාගේ සහාය හවුල්කරුවන්ට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ද ඔවුන්ගේ කැපවීම හා සහයෝගය වෙනුවෙන් මම ස්තූති කරමි.

සාමාන්‍යාධිකාරිවරයාගේ ප්‍රධානත්වයෙන් වෙහෙස නොබලා ක්‍රියාකරන ලද සියළුම සේවක මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ පරිශ්‍රමය නොවූවා නම් මෙම පරිච්ඡේදවල වාර්තා කර ඇති කාර්යසාධනය අත්කර ගැනීමට නොහැකි වනු ඇත.

සියළුම ලෙකෝ ගනුදෙනුකරුවන්ට, පාරිභෝගිකයන්ට, කොටස්හිමියන්ට, ආශ්‍රිත ව්‍යාපාරයන්ට, බැංකුකරුවන්ට, සැපයුම්කරුවන්ට, සමාගමේ ලේකම්වරුන්ට, විගණකවරුන්ට හා මෙහි සඳහන් නොවූ සියළුම අයට පසුගිය වර්ෂය සාර්ථක වර්ෂයක් කිරීම සඳහා ඔවුන්ගේ අනුග්‍රහය සහ සහයෝගය වෙනුවෙන් මාගේ කෘතඥතාවය හා ඇගයීම සඳහන් කිරීමට ද කැමැත්තෙමි.

විශාල ආර්ථික හා යටිතල සංවර්ධනය වැඩිදියුණු කිරීමේදී හා ධෛර්‍යය දීමේදී රජය සහ වෙනත් අය සමඟ හවුල්කරුවකු වීමට ලෙකෝ සඳහා හැකිවීමට 2014 වර්ෂයේදී විශාල බලාපොරොත්තු හා අපේක්ෂාවන් ඇති බව අවසානයේ ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. තනි පියවරක් ලෙස ගමන් මග ආරම්භ කර එහි 30 වැනි වර්ෂය උත්කර්ෂවත් කරමින් බොහෝ අභියෝග තිබියදී මෙම විශාල ගමන් මග අඛණ්ඩව ඉදිරියට ගෙන යන බවට අන්‍යෝන්‍යව සාරවත් වූ අපගේ සියළු උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ විශ්වාසය යළි තහවුරු කරමින් මම ප්‍රතිඥා දෙමි.

**සාගර කාරියවසම්**
නීතිඥ
සභාපති

# අධ්‍යක්ෂ මණ්ඩලය



පී.කේ.ඒ.ඩී. ද සිල්වා මහත්මිය
අධ්‍යක්ෂ

එච්.පී. සාගර කාරියවසම් මහතා
සභාපති

ඩබ්ලිව්.බී. ගනේගල මහතා
අධ්‍යක්ෂ

ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා
අධ්‍යක්ෂ

රොහාන් සෙනෙවිරත්න මහතා
අධ්‍යක්ෂ
(ඡයාරූපයේ නොමැත)

## සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම වාර්ෂික වාර්තාව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

2007 අංක 07 දරන සමාගම් පනතේ 168 වගන්තිය ප්‍රකාරව සමාගමේ කටයුතු පිළිබඳ අවශ්‍ය තොරතුරු හා වෙනත් අතිරේක තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් වේ.

**සමාගමේ හා පරිපාලිතයන්හි මූලික කාර්යයන් සහ වර්ෂය තුළ කාර්යසාධන සමාලෝචනය**
සමාගමේ වර්ෂය තුළ නොවෙනස්ව පැවතුන, ප්‍රධාන කාර්යය වූයේ විදුලි බලය පිළිබඳ සිල්ලර වෙළෙඳාම් ව්‍යාපාරයයි. ලංකා විදුලිබල මණ්ඩලය සතුව පවතින හා කළමනාකරණය කෙරෙන ජාතික විදුලිබල ධාරිතාවයෙන් විදුලි බලය තොග වශයෙන් මිලදී ගන්නා අතර සමාගම විසින් කළමනාකරණය කෙරෙන නවීන බෙදාහැරීම් පද්ධතියක් මගින් ගනුදෙනුකරුවන්ට බෙදාහරිනු ලැබේ.

පරිපාලිත සමාගම් හා ඒවායේ ප්‍රධාන කටයුතු පහත පරිදි වේ.

සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම

රට තුළ විදුලි බලය බෙදාහැරීමේදී යටිතල පහසුකම් සැපයීම සඳහා

සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම

ශ්‍රී ලංකාවේ හා අපනයන වෙළෙඳපොළට විද්‍යුත් මීටර් අවශ්‍යතා ලබාදීමට බලශක්ති මීටර් නිෂ්පාදන පහසුකම සඳහා

| | 2013 | | 2012 | |
|---|---|---|---|---|
| | **සමූහය** | **සමාගම** | **සමූහය** | **සමාගම** |
| ආදායම | 22,373,120 | 21,660,450 | 19,761,169 | 18,941,440 |
| දළ ලාභය | 2,814,553 | 2,760,835 | 3,899,920 | 3,793,425 |
| බදුවලට පෙර ලාභය | (57,542) | (89,347) | 2,415,351 | 2,399,174 |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | 294,537 | 243,146 | 2,003,981 | 1,944,353 |

**මූල්‍ය ප්‍රකාශන**
සමාගමේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන එච්.පී. සාගර කාර්යවසම් මහතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඩබ්ලිව්.ඩී. ගනේගල මහතා විසින් නියමිත පරිදි අත්සන් කරන ලදී.

**විගණකගේ වාර්තාව**
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඇතුළත් කර ඇත.

# සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්/ශ්‍රී ලං ගි ප්‍රමිතිවලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද අතර පිටු අංක 31 සිට 41 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 2.2 සිට 2.5 යටතේ දක්වා ඇත.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 1,145.1 ක් වූ අතර එය 'ඒ' පන්තියේ සාමාන්‍ය කොටස් 113,580,264කින් හා 'බී' පන්තියේ සාමාන්‍ය කොටස් 926,390කින් නියෝජනය වේ.

සමාගමේ කොටස් ප්‍රාග්ධනයේ සංචලනය ගිණුම්වල සටහන් 09 හි දැක්වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

ගිණුම් කාල පරිච්ඡේදය අවසානයට සමූහයේ නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් පහත දැක්වේ.

එච්.ජී. සාගර කාරියවසම් මහතා
(2013 මාර්තු 08 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කර ඇත.)

ඩබ්ලිව්.බී. ගනේගල මහතා
(2013 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කර ඇත.)

පී.කේ.ඒ.ඩී. ද සිල්වා මහතා

රොහාන් සෙනෙවිරත්න මහතා

ඩී.පී.එස්. ජයවර්ධන මහතා
(2013 මාර්තු 08 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කර ඇත.)

ඩබ්ලිව්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා
(2013 ඔක්තෝබර් 10 දින පත්කර ඇත.)

එම්.එස්. ද කොස්තා මහතා
(2013 නොවැම්බර් 13 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කර ඇත.)

සී.ජේ. හපුතන්ත්‍රි මහතා 2013 පෙබරවාරි 8 දින සිට ධුරයෙන් ඉල්ලා අස් වූ අතර එච්.ජී. සාගර කාරියවසම් මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් හා අධ්‍යක්ෂ මණ්ඩල සභාපති වශයෙන් 2013 මාර්තු 8 දින පත් කරන ලදී.

මහාචාර්ය ඩබ්ලිව්. අබේවික්‍රම මහතා 2013 ජනවාරි 31 දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලද අතර, සාංගමික ව්‍යවස්ථාවලියේ 81(i) ව්‍යවස්ථාව ප්‍රකාරව ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති වශයෙන් වැඩ භාරගත් ඩබ්ලිව්.බී. ගනේගල මහතා සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් නිල බලයෙන් 2013 මාර්තු 01 දින සිට පත්වන ලදී.

ඩී. ප්‍රියන්ත එස්. ජයවර්ධන මහතා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් 2013 මාර්තු 08 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කර තිබූ අතර 2014 අප්‍රේල් 28 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වී තිබුණි.

ඒ.ඒ.ආර්. අබේසිංහ මහතා 2013 මාර්තු 01 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී.

ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වශයෙන් බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය මහතාගේ ධුර කාලය අවසන් වූ අතර, සාංගමික ව්‍යවස්ථාවලියේ 81(i) ව්‍යවස්ථාව ප්‍රකාරව ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වශයෙන් එම ධුරයට පත්වූ එෆ්.කේ. මොහිදීන් මහතා 2013 ජූලි 01 දින සිට නිල බලයෙන් සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත්වන ලදී. පසුව 2013 ඔක්තෝබර් 09 දින සිට බලපැවැත්වෙන පරිදි එෆ්.කේ. මොහිදීන් මහතාගේ ධුර කාලය අවසන්වීම හේතුවෙන් 2013 ඔක්තෝබර් 10 දින ඩබ්ලිව්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා ඒ වෙනුවෙන් පත් කරන ලදී.

# සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

පී. කොඩිතුවක්කු හා එස්. ද කොස්තා මහත්වරුන්
2014 මැයි 05 දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

## පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය

සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම

එච්.ජී. සාගර කාරියවසම් මහතා
ඩබ්ලිව්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා
ලිවු පියාන්වු මහතා
ෂෙන් ඩින්ග්ක්වින් මහතා
එච්.එස්. සෝමතිලක මහතා

## සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම

එච්.ජී. සාගර කාරියවසම් මහතා
ආචාර්ය ඩී.එම්.ඩී.ඕ.කේ. දිසානායක මහතා
ඩබ්ලිව්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා
එච්.එස්. සෝමතිලක මහතා
ඒ.ඒ.ආර්. අබේසිංහ මහතා

## අයිතිය පිළිබඳ ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ දක්වා ඇති පරිදි සමාගම සහ පරිපාලිතයන් විසින් අයිතිය පිළිබඳ ලේඛන පවත්වනු ලැබේ.

සමාලෝචිත ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ සමාගම සමඟ කොන්ත්‍රාත්තුවක හෝ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවක සෘජුව හෝ වක්‍රව සම්බන්ධිත අධ්‍යක්ෂවරුන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 යටතේ දක්වා ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

මූල්‍ය ප්‍රකාශනවල සටහන් 26.3 හි අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික හෙළිදරව් කර ඇති අතර පරිපාලිතයෙහි අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික, සමූහය තීරුව යටතේ සටහන් 20 තුළ අධ්‍යක්ෂ ගාස්තුවල ඇතුළත් කර ඇත.

## පරිත්‍යාග

සමාගම හා සමූහය වර්ෂය තුළ සිදුකරන ලද පරිත්‍යාග හා දායකයන් පිළිවෙළින් රු.175,000 ක් හා රු.233,000 ක් විය.

## ලාභාංශ

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොටසකට රු.0/50 බැගින් පළමු හා අවසන් ලාභාංශයක් වශයෙන් රු. මිලියන 57.25ක මුළු දළ ලාභාංශයක්, විගණකවරුන්ගෙන් නුබුන්වත් සහතිකය ලැබීමට යටත්ව අනුමත කරන ලදී.

## දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ සංචලනය සම්බන්ධයෙන් තොරතුරු විගණිත ගිණුම්වල සටහන් 3 හි දක්වා ඇත.

# සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

## සංචිත
රු. බිලියන 1.55 ක් වූ ප්‍රාග්ධන සංචිත සහ රු. බිලියන 12.53 ක් වූ ආදායම් සංචිතවලින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු සංචිත රු. බිලියන 14.08 ක් විය. මූල්‍ය ප්‍රකාශනවල සටහන් 10න් සංචලනය දැක්වේ. කාලපරිච්ඡේදය තුළ සමූහ සංචිතය රු. බිලියන 14.2 ක් වූ අතර රු. බිලියන 1.6ක ප්‍රාග්ධන සංචිත හා රු. බිලියන 12.6 ආදායම් සංචිත එයින් නියෝජනය වේ.

## සේවා නියුක්තිය
2013 වර්ෂය අවසානයට සමාගමේ සේවයේ යොදවා ඇති පුද්ගලයන් සංඛ්‍යාව 1,462 ක් විය. (2012 අවසානයට - 1,463)

## වගකීමට බැඳීම හා අසම්භාව්‍යයන්
2013 දෙසැම්බර් 31 දිනට වගකීමට බැඳීම හා අසම්භාව්‍යයන් මූල්‍ය ප්‍රකාශනවල සටහන 24.2 හි දක්වා ඇත.

## විගණකවරු
සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ විගණකවරු ලෙස අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරිවරුන් සේවය සලසන ලදී. සමාගමේ බදු අනුකූලවීමේ සේවාව අමරසේකර ඇන්ඩ් කම්පැනි වරලත් ගණකාධිකාරිවරුන් විසින් සපයන ලද අතර ඔවුන් සමාලෝචිත වර්ෂය තුළ සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් කම්පැනි (පුද්ගලික) සමාගමේ විගණකවරුන් ද වේ. අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරිවරුන් සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ විගණකවරුන් ලෙස ද ක්‍රියාකරයි. විගණක වශයෙන් සහ ඉහත දක්වන ලද බදු අනුකූලතා උපදේශක වශයෙන් හැර සමාගමේ හෝ එහි සමූහ සමාගම්වල කිසිදු අයිතියක් විගණකවරුන්ට නොමැත.

සමාගම විසින් ප්‍රතිපූර්ණය කළ යුතු වියදම් (බදු නොමැතිව) ඇතුළත් රු.2,568,000ක මුදලක් විගණකවරුන්ට සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු ලෙස ගෙවිය යුතුය.

ප්‍රතිපූර්ණය කළ යුතු වියදම් (බදු නොමැතිව) ඇතුළත් රු.275,990ක මුදලක් බදු නොමැතිව විගණන ගාස්තු ලෙස සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම වෙනුවෙන් ගෙවිය යුතු අතර ප්‍රතිපූර්ණය කළ යුතු වියදම් (බදු නොමැතිව) ඇතුළත් රු.99,960ක මුදලක් සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම වෙනුවෙන් බදු නොමැතිව විගණන ගාස්තු ලෙස ගෙවිය යුතුය.

සමාගම සඳහා විගණන නොවන ගාස්තු රු.988,847 ක් වූ අතර එය සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් සමාගම සඳහා රු.183,672 ක් විය. සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම සඳහා විගණන නොවන ගාස්තු නොතිබුණි.

විගණකවරුන් ඔවුන්ගේ සේවය අඛණ්ඩව සැපයීමට කැමැත්ත ප්‍රකාශකර ඇත. විගණකවරුන් නැවත පත්කිරීම සඳහා හා ඔවුන්ගේ පාරිශ්‍රමික තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ට බලතල ලබාදීමට යෝජනාවක් වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා කරනු ඇත.

**ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

මෙම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට අවශ්‍ය හෝ හෙළිදරව් කිරීමට සිදුවන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් වාර්තාකරණ දිනයට පසු සිදුවී නැත.

මෙම වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපති හා අධ්‍යක්ෂවරයකු විසින් අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

පී.ඩබ්. කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) ලිමිටඩ්
ලේකම්වරු

2014 මැයි 12 දින

# මානව සම්පත් හා පරිපාලනය

වඩාත් වැදගත් උපායමාර්ගික අංශය මානව සම්පත ලෙස සමාගම විසින් හඳුනා ගැනීමෙන්, පුහුණු හා සංවර්ධනය, සේවක සුබසාධනය හා වෙනත් සමාජ කාර්යයන් යන ක්ෂේත්‍ර යටතේ මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා බොහෝ පියවරයන් ගන්නා ලදී.

වර්ෂය තුළදී තාක්ෂණික කාර්ය මණ්ඩලයට හා විධායක කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ කුසලතා හා කණ්ඩායම් ධෛර්යය වැඩිදියුණු කිරීමට අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සැලසුම් කරන ලදී.

එම කාර්යයන්හි අරමුණ වුයේ අඛණ්ඩ පදනමක් මත ව්‍යාපාර උපාය මාර්ග සපුරා ගැනීමට සහාය මානව සම්පත් කාර්යයන් මඟින් තහවුරු කිරීම සඳහා සහ වටිනාකමක් එකතු කරන ඔවුන්ගේ කාර්යයන් පිළිබඳ සචේතනිකව සැලකිල්ලක් දැක්වීමයි. වර්ෂය තුළ සියළු මානව සම්පත් කාර්යයන් මඟින් සමාගම තවදුරටත් සේවක සම්බන්ධතා වැඩිදියුණු කිරීම පිළිබඳ සඳහන් කිරීමට හැකිවීම පිළිබඳව ද අපි සතුටු වෙමු.

දිගු කාලයක සිට අවශ්‍යතාවයක් ලෙස පැවති උසස්වීම් යෝජනා ක්‍රමය වර්ෂය තුළ ක්‍රියාත්මක කළ අතර උසස්වීම් සඳහා සේවක දුක් ගැනවිලි යම්තාක් දුරකට විසඳන ලදී. සමාන ව්‍යාපාරවලට අනුකූලවන පරිදි අපගේ සේවකයන්ගේ ක්‍රය ශක්තිය වැඩිදියුණු කරමින් සියළු ස්ථිර සේවකයන්ගේ වැටුප් වර්ෂය ආරම්භයේදී 8.5%කින් වැඩි කරන ලදී.

2013 වර්ෂය වන විට සමාගම ජාතියට සේවා සැලසීමේ වර්ෂ 30ක කාලයක් සම්පූර්ණ කළ අතර වර්ෂ 25ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් 200 දෙනෙකුට පමණ දිගුකාලීන සේවා ප්‍රදාන ලබාදෙන ලදී. මෙම අවස්ථාවේදී සේවකයන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ද ප්‍රදානය කරන ලදී.

සේවකයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා/වටහාගැනීම් වැඩිදියුණු කිරීමේ අරමුණින් අන්තර් ශාඛා ක්‍රීඩා උත්සවයක් නාරාහේන්පිට ශාලිකා ක්‍රීඩාංගනයේ වාර්ෂික අංගයක් ලෙස පවත්වන ලදී. මෙම අවස්ථාවට සේවකයන්ගේ පවුල්වලට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථා සලසන ලදී. සහභාගිත්වය 2000 ක් ලෙස වාර්තා විය.

සමාගමේ සහයෝගය සහිතව විවිධ සුබසාධන සංගම් විසින් සංවිධානය කරනු ලදුව සේවකයන් විසින් ආගමික කටයුතු සමඟ 2014 වර්ෂය ආරම්භ කරන ලදී. ව්‍යාපාර සාමුහිකත්වය තිබියදී කාර්ය-ජීවන සාමුහිකත්වය දක්වමින් සර්වරාත්‍රික පිරිත් සජ්ජායනාවක් සහ වෙනත් ආගමික කටයුතු ප්‍රධාන කාර්යාලයේ හා ශාඛාවල සිදුකරන ලදී.

සමාගමේ ආශිර්වාදය සහිතව සුබසාධන සංගමය විසින් ලේ දන්දීමේ ව්‍යාපාරයක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අතර මෙය ඉතා සාර්ථක අවස්ථාවක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ සේවක ශක්තිය 1,470 ක් විය. 18 දෙනෙකු අළුතින් බඳවා ගන්නා ලද අතර විශ්‍රාම යාම් හා වෙනත් ආකාරයක වැඩ නැවැත්වීම් එයට හේතු විය. වෘත්තීය සංගම් සමඟ සමාගමේ කළමනාකාරිත්වය නිතර සංවාද පවත්වන අතර යහපත් ව්‍යාපාර සම්බන්ධතා පවත්වා ගැනීමේදී ඔවුන්ගේ සහයෝගය හා ආධාර ඉතා අගය කරනු ලැබේ.

# ඉංජිනේරු අංශය

පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව, නියාමන කටයුතු දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුවෙන් සමන්විත ඉංජිනේරු අංශය සඳහා 2013 වර්ෂය ඵලදායිතා වසරක් වේ.

සැලසුම් හා සංවර්ධනය, ප්‍රසම්පාදනය, තොරතුරු තාක්ෂණය සහ පුහුණුව සහිත පද්ධති සංවර්ධන දෙපාර්තමේන්තුව ඉංජිනේරු අංශය තුළ ප්‍රධාන ක්‍රියාත්මක ඒකකය වේ. ප්‍රසම්පාදන අංශය දළ වශයෙන් ප්‍රසම්පාදනයන් 600 ක් මෙහෙයවනු ලැබේ. පිරිවිතරයන් සඳහා ප්‍රධාන සංශෝධන කිහිපයක් සිදුකර ඒවා ක්‍රියාත්මක කරන ලදී. තොග මාර්ග හා පාලනය සඳහා අභ්‍යන්තරිකව සංවර්ධනය කරන ලද මෘදුකාංගයක් මගින් ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවට සහාය ලබාදෙන ලදී.

පාලන මධ්‍යස්ථාන ස්වයංක්‍රීය මෘදුකාංග, ගනුදෙනුකරු සේවා පැකේජ, වත්කම් කළමනාකරණ පැකේජය සහ SMS මෘදුකාංග වැනි අභ්‍යන්තරික සංවර්ධනයන් කිහිපයක් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී. මෘදුකාංග සංවර්ධනය සඳහා අළුතෙන් ස්ථාපිත තොරතුරු තාක්ෂණ අංශයේ උප අංශය අභ්‍යන්තරික ව්‍යවහාර පද්ධති සංවර්ධනය කිරීමෙහිලා විශාල සාර්ථකත්වයක් විය.

මුළු පුහුණු මිනිස් දින දළ වශයෙන් 1,600 ක් සඳහා දළ වශයෙන් පුහුණු සැසි 140 ක් පුහුණු මධ්‍යස්ථානය විසින් පවත්වන ලදී. මෙය වර්ෂය සඳහා සැලසුම් කරන ලද පුහුණු මිනිස් දින 1,500 ක් වූ ඉලක්කය ඉක්මවා තිබුණි. ඊට අමතරව විධායක කාර්ය මණ්ඩලය සඳහා බාහිර වැඩසටහන් කිහිපයක් මෙන්ම විදේශ පුහුණු සැසි කිහිපයක් ද පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කරන ලදී.

පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉලක්ක කරන ලද මීටර් පරීක්ෂණ මෙහෙයුම් වර්ෂයේ මාස 9 ක් තුළ සිදුකිරීම මගින් ඉහළ කාර්යසාධනයක් ඉටුකර ගන්නා ලදී. තවද අභ්‍යන්තරිකව සංවර්ධනය කරන ලද දුරස්ථ පාලක මීටර් කියවීමේ මෘදුකාංගයක් යොදා ගනිමින් 2013 වර්ෂයේදී පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කැපී පෙනෙන ඉටුකර ගැනීමක් පෙන්වා තිබුණි. දැනට මෙම මෘදුකාංගය මගින් තොග මීටර් සියල්ල දුරස්ථ පාලකයෙන් කියවනු ලැබේ.

අභිනවයෙන් ඇති කරන ලද නියාමන දෙපාර්තමේන්තුව විසින් නියාමන කටයුතු ක්‍රියාත්මක කරන අතර උපයෝගිතා රෙගුලාසිවලට අදාළ සංකේත හා රෙගුලාසි පිළියෙල කිරීමේදී, මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ එක්ව කටයුතු කරයි. සැපයුම් සේවා සංකේත, පරිභෝගික හිමිකම් හා වගකීම්, ආරක්ෂාව, තත්ත්වය හා පවත්වාගෙනයාමේ රෙගුලාසි හා බෙදාහැරීම් කාර්යසාධන ප්‍රමිති දැනටමත් බලාත්මක කර ඇති අතර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කෙරේ. නියාමන කටයුතු පිළිබඳ වටිනා කළමනාකරණ තොරතුරු නියාමන තොරතුරු පද්ධතියෙන් සැපයේ. මෙය නියාමන දෙපාර්තමේන්තුව විසින් මාසිකව ප්‍රසිද්ධ කරනු ලැබේ.

ව්‍යාපෘති දෙපාර්තමේන්තුවට මෙය ප්‍රගමන වසරක් වූ අතර බොහෝ අපේක්ෂාවෙන් සිටි මූලික උපපොළවල් වන කටුනායක, කිරිබත්ගොඩ, කොටිකාවත්ත, නාවල හා හික්කඩුව යන ව්‍යාපෘතිවල 2014 වර්ෂයේ මුල් භාගය තුළ උප පොළවල් පහම ස්ථාපනය කිරීමට හැකිවීමෙන් විශාල ප්‍රගතියක් දක්වා තිබුණි.

# විශේෂ විමර්ශන ඒකකය

## 2013 වර්ෂය සඳහා විශේෂ විමර්ශන ඒකකයේ (SIU) කාර්යයන් පිළිබඳ ප්‍රගතිය

නීත්‍යානුකූල නොවන පරිදි අපගේ පද්ධතියෙන් විදුලි බලය ලබාගත් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට පොලිසියේ සහාය ඇතිව වැටලීම් සිදුකිරීම සඳහා හා එහිදී ඇතුළත් අඩුවෙන් අයකළ ගාස්තු ආදිය අයකර ගැනීම සඳහා විදුලිබල පනතේ විධිවිධාන යටතේ වැරදිකරුවන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට 2008 සැප්තැම්බර් මාසය තුළදී ලෙකෝ හි විශේෂ විමර්ශන ඒකකය ස්ථාපිත කරන ලදී.

වර්ෂය තුළ විශේෂ විමර්ශන ඒකකය විසින් නොවැම්බර් අවසානය දක්වා **සාර්ථක වැටලීම් 252 ක්** සිදුකරන ලදුව, ඒ අනුව අඩුවෙන් අයකර ගැනීම් වශයෙන් වූ **රු.27,666,615.86ක** ආදායමක් ලබාගැනීමට සමත් විය. මෙයට අමතරව විදුලිබල පනතේ විධිවිධාන යටතේ අදාළ මහේස්ත්‍රාත් අධිකරණවල ඔවුන්ට විරුද්ධව ගත් නීතිමය කටයුතුවලින් වරදකරුවන් බවට පත්වූ අයට පනවන ලද ව්‍යවස්ථාපිත දඩ වශයෙන් රජයට ද **රු.1,550,000ක** ආදායමක් එකතු කරන ලදී. විශේෂ විමර්ශන ඒකකය එහි ආරම්භයේ සිට 2013 නොවැම්බර් අවසානය දක්වා එසේ ලබා ගැනීමට සමත්වූ ආදායම **රු.111,663,025.60ක්** විය.

2012 වර්ෂයේ මුළු ආදායම සමග සැසඳීමේදී 2013 නොවැම්බර් දක්වා සංඛ්‍යා මත පදනම්ව ආදායම් වර්ධනය 9.3% ක් විය. මීටර් වෙනස් කිරීම මගින් විදුලි බලය වංචා කරන ලද අයගෙන් පාඩුව අයකර ගැනීම සඳහා 2013 ජූලි දක්වා විදුලිබල පනතට නෛතික ප්‍රතිපාදන නොමැතිව විශේෂ විමර්ශන ඒකකය විසින් මෙම සපුරා ගැනීම් සිදුකරන ලදී. 2013 ජූලි මාසයේදී පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද 2013 අංක 31 දරන සංශෝධන පනත මගින් මෙය නිවැරදි කර ගන්නා ලදී.

මෙම සියළු කරුණු හැර විශේෂ විමර්ශන ඒකකය (SIU) ප්‍රාථමික විමර්ශනයන් කීපයක් සතුටුදායකව අවසන් කිරීම සඳහා වගකීම දරයි. එසේම ආයතනයේ විනයානුකූල පාලනය වැඩිදියුණු කිරීමට ඉවහල් වන එහි ප්‍රතිඵල මුදල්වලින් මිණිය නොහැකි වෙනත් විනයානුකූල සම්බන්ධිත ක්‍රියාමාර්ගයන් සඳහා විශේෂ විමර්ශන ඒකකය ලෙකෝ සඳහා සහාය විය.

# මෙහෙයුම් අංශය

අපගේ මුළු ගනුදෙනුකරු පදනම 507,986ක සංඛ්‍යාවක් සඳහා ළඟා වෙමින් 2013 වර්ෂය ගනුදෙනුකරු වර්ධනය 1.43% ක් ලෙස වාර්තා කරන ලදී. 4.6%ක බෙදාහැරීම් පාඩුවක් සහිතව මෙගා වොට් පැය 1,220,914 ක් ගනුදෙනුකරුවන්ට සැපයීමට හැකිවී තිබුණි. වර්ග වශයෙන් ගනුදෙනුකරු ශක්තිය හා වාර්ෂික පරිභෝජනය පහත වගුවෙන් දැක්වේ.

| ගාස්තු වර්ගය | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | % | වාර්ෂික පරිභෝජනය කි.වො. පැය | % |
|---|---|---|---|---|
| ගෘහස්ථ | 426,406 | 84.74 | 514,122,304 | 42.11 |
| පොදු කටයුතු | 71,139 | 14.14 | 389,606,051 | 25.98 |
| ආගමික, ව්‍යාපාර හා හෝටල් | 5,667 | 1.13 | 317,186,500 | 31.91 |

2013 වර්ෂය අවසානයට ඉහළ වෝල්ටීයතා රැහැන් කි.මී.1,120 දක්වා හා අඩු වෝල්ටීයතා රැහැන් කි.මී.3620 දක්වා බෙදාහැරීම් උප පොළවල් 2,187 ක් හා තොග උප පොළවල් 1,398ක සංඛ්‍යාවක් සහිතව බෙදාහැරීම් පද්ධති වත්කම් සඳහා ළඟාවී ඇත. පද්ධතියට 2013 වර්ෂය තුළදී එකතු කරන ලද මුළු බෙදාහැරීම් වත්කම් වටිනාකම රු. මිලියන 595,390 ක් විය. වර්ෂය තුළ ශුද්ධ මීටර සම්බන්ධතා 218 ක් ලෙකෝ මගින් සැපයීම පිළිබඳ සඳහන් කිරීම වටිනේය.

ගාලු කොටුවට නව ආලෝකකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම මගින් ගාලු කොටුවේ සාමාන්‍ය ජනතාව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ලෙකෝ විසින් දායක වී ඇත. හික්කඩුව මුහුදු වෙරළ අලෝක කිරීම සඳහා ලාම්පු කණු සවි කිරීම ද වර්ෂය තුළදී සිදුකරන ලදී. මෙම කටයුතු කොමන්වෙල්ත් රාජ්‍ය නායකයන්ගේ සම්මන්ත්‍රණයට සමගාමීව එහි සංවිධායකවරුන්ගේ ඉල්ලීම පරිදි සිදුකරන ලදී.

2013 වර්ෂය අවසානය වන විට බෙදාහැරීම් පාඩුව 4.6%කට පවත්වා ගැනීමට ලෙකෝ සමත් වු අතර ශාඛා වශයෙන් පාඩු පිළිබඳ පාලන කටයුතු තීව්‍ර කර අධීක්ෂණය කරනු ලැබේ.

විදුලිය ක්‍රියාවිරහිත කාලයට සැපයීම සඳහා පද්ධති ඇනහිටීම් සාමාන්‍ය කාල දර්ශකය (System Average Interruption Duration Index-SAIDI) 2013 වර්ෂයේ එක් පාරිභෝගිකයකුට පැය 65.4 ක් විය. ක්‍රියාවිරහිත කාලයට සැපයීම සඳහා 2013 වර්ෂයේ පද්ධති ඇනහිටීම් සාමාන්‍ය සංඛ්‍යාත දර්ශකය (System Average Interruption Frequency Index-SAIFI) එක් පාරිභෝගිකයකුට ක්‍රියාවිරහිත කාලය පැය 97 ක් විය. පද්ධති ඇනහිටීම් කාල දර්ශකය - SAIDI පෙර වර්ෂය සමග සැසඳීමේදී සියයට 30ක අඩුවීමක් දැක්වේ. සැලසුම් කරන ලද විදුලි ක්‍රියාවිරහිත කාලය හා අසමත්වීම් හේතුවෙන් පද්ධති ඇනහිටීම් සාමාන්‍ය කාල දර්ශකයේ විස්තර රූප සටහන 1 හි විස්තර කෙරේ.




රූප සටහන 1

# මූල්‍ය සමාලෝචනය

ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම් වස් ඵලදායීව හා කාර්යක්ෂමව මූල්‍යයන වෙන්කිරීමේ හා භාවිත කිරීමේ ක්‍රියාවලියේදී ඇතුළත් කාර්යයන්හි සමස්ත පෙළ ගැස්ම මෙයින් දැක්වේ.

මූල්‍ය වටිනාකම නිර්මාණය කරන ක්‍රමවේදය වන්නේ මූල්‍ය හා මූල්‍ය නොවන යෙදවුම් මූල්‍ය කාර්යසාධනය ලෙස මිණීම් කෙරෙන නිමැවුම බවට පරිවර්තනය කිරීම බව ලෙකෝ ප්‍රත්‍යක්ෂ කරයි.

**මූල්‍ය අවධානයන් (සමූහ මට්ටම)**

| **වර්ෂය** | **2013** | **2012** | **2011** | **2010** |
|---|---|---|---|---|
| **ලාභදායිත්වය** | | | | |
| විකුණුම් (රු. මිලියන) | 22,373,120 | 19,761,169 | 19,079,629 | 14,354,489 |
| දළ ලාභය (%) | 13% | 20% | 19% | 11% |
| ශුද්ධ ලාභය (%) | 1.32% | 10.14% | 10.86% | -4.17% |
| **කාරක ප්‍රාග්ධන කළමනාකරණය** | | | | |
| වර්ෂය අවසානයට ජංගම අනුපාතය (ගුණය) | 1.78 | 1.83 | 2.10 | 1.70 |
| වර්ෂය අවසානයට ක්ෂණික වත්කම් අනුපාතය (ගුණය) | 1.63 | 1.54 | 1.87 | 1.45 |
| ස්ථාවර වත්කම් පිරිවැටුම (ගුණය) | 2.16 | 1.88 | 2.20 | 1.69 |

පෙර වර්ෂයට  සාපේක්ෂව ලාභය අඩුවී තිබුණ ද, 2013 වර්ෂය සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම සඳහා තවත් එක් ලාභදායී වසරක් වේ. මෙම පහත වැටීම 2012 හා 2013 වර්ෂ සඳහා තොග සැපයුම් ගාස්තු වැඩිවීමෙන් හා ඒකාකාරී ජාතික ගාස්තු ක්‍රමය (Uniform National Tariff) ගැලපීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවී තිබුණි.

2013 වර්ෂයේදී විකුණන ලද ඒකක ප්‍රමාණය ගි.වො.පැ 1221 ක් වූ අතර එය 2012 වර්ෂයේදී ගි.වො.පැ 1216 ක් වූ හෙයින් විකුණුම් වර්ධනය 0.4% ක් විය. සාමාන්‍ය විකුණුම් මිල රු.17.74 ක් හා සාමාන්‍ය මිලදී ගැනීම් මිල රු.14.45 ක් විය.

2013 වර්ෂයේදී රු. මිලියන 164ක මෙහෙයුම් ලාභයක් උපයා ගැනීමට ලෙකෝ සමත් වූ අතර ඊට අමතරව ආයෝජන කටයුතුවලින් රු. මිලියන 864 ක් සමාගමට උපයා ගැනීමට හැකි විය. 2013 වර්ෂයේදී සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ ආයෝජනය කිරීමෙන් රු. මිලියන 573ක ශුද්ධ ලාභාංශ ලැබී තිබූ අතර සීමාසහිත ඇන්ටි ලෙකෝ (පුද්ගලික) සමාගමේ ආයෝජනයෙන් රු. මිලියන 3.4ක ශුද්ධ ලාභාංශ ලැබී තිබුණි.

අනුමත පුනරාවර්තන වියදම් අයවැය තුළ සමාගමට එහි කටයුතු සිදුකර ගෙනයාමට හැකි විය. ලෙකෝ සමාගම මුදල් හා මුදල් සමාන වන රු. මිලියන 1,105.6ක ශුද්ධ වර්ධනයක් උත්පාදනය කර තිබුණි.

වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් සංවිධානය කරන ලද, 2013 වර්ෂයේ වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදානයේදී ලංකා විදුලි සමාගම, විදුලිබල හා බල ශක්ති වර්ගය යටතේ අනුකූලතා සම්මානය ලබාගැනීමට සමත් විය. 2013 වර්ෂයේදී ද අප විසින් තත්ත්වාගණනය නොකළ විගණන මතයක් ලබා ඇත.

මෙම සාර්ථකත්වය ඉටුකර ගැනීම සඳහා දායකත්වය සැපයූ මාගේ කැපවීමෙන් කටයුතු කළ කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුද කරමි.



# අපි
# සහයෝගී වෙමු

අපගේ ප්‍රජාව කේන්ද්‍ර කර ගත් අපගේ මෙහෙයුම් මඟින්
සාරවත් විසඳුම් ලබාදීමට හා නිර්මාණය කිරීමට
අපගේ කණ්ඩායමට සහයෝගය දෙන
අපගේ අද්විතීය ගනුදෙනුකරු පිළිබඳ අවබෝධය

# ආයතනික කළමනාකරණය



**ඩී. මුණසිංහ මහතා**
මානව සම්පත් ප්‍රධානී හා පරිපාලන කළමනාකරු

**එච්.එස්. සෝමතිලක මහතා**
සාමාන්‍යාධිකාරී

**සුනිල් පෙරේරා මහතා**
ප්‍රධාන මූල්‍ය නිලධාරී

**මහාචාර්ය පී.එස්.එන්. ද සිල්වා මහතා**
ඉංජිනේරු ප්‍රධානී

**එච්.එන්. ගුණසේකර මහතා**
මෙහෙයුම් ප්‍රධානී

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණය



**එච්.එච්. සුමනදාස මහතා**
පද්ධති මෙහෙයුම් කළමනාකරු

**කේ.ජී. කුලරත්න මහතා**
ව්‍යාපෘති කළමනාකරු

**එස්.එල්. ජයසේකර මහතා**
ගණුදෙනුකරු සේවා කළමනාකරු

**එස්.ඩී.සී. ගුණවර්ධන මහතා**
පද්ධති සංවර්ධන කළමනාකරු

**මධුර ගමගේ මහතා**
නියාමන කළමනාකරු

**ඉසෙඩ්.ඒ. බසිත් මිය**
කළමනාකරණ ගණකාධිකාරී

**එන්. ඒකනායක මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක



# අපි
# පරිවර්තනය වෙමු

අප ගනුදෙනුකරුවන්ට අළුත් අත්දැකීම් ලබා දෙමින් සහ
ජීවිත, ප්‍රජාව සාරවත් කරමින් සහ
පෙර නොවූ විරූ වර්ධනයක් වූ ගමන් මඟට
අපි අවතීර්ණ වූයෙමු.

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

## සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ කොටස් හිමිකරුවන් සඳහා

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව**

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ('සමාගම') මූල්‍ය ප්‍රකාශන හා සමාගමේ හා එහි පරිපාලිතයන්ගේ ('සමූහය') ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

අපගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව අපගේ විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස අප විසින් විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට එම ප්‍රමිතිවලින් අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් විගණනයට ඇතුළත් වේ. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

අපගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් අප විසින් ලබාගන්නා ලදී. ඒ අනුව අපගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් අපගේ විගණනය මඟින් සපයන බව අපගේ විශ්වාසයයි.

**මතය**

**සමාගම**

අපගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව අපගේ මතය වේ.

**සමූහය**

සමාගමේ කොටස් හිමියන් සම්බන්ධයෙන් බලන කල සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් දිනට සමාගමේ හා එහි පරිපාලිතයන්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව අපගේ මතය වේ.

**වෙනත් නෛතික හා නීත්‍යානුකූල අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 151(2) හා 153(2) සිට 153(7) වගන්තිවල අවශ්‍යතාවයන්ට මෙම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන බව අපගේ මතය වේ.




2014 මාර්තු 14 දින,
කොළඹදී ය.

**සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම සහ එහි පරිපාලිතයන් සඳහා**

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | 2013 | 2012 | 2013 | 2012 |
| **වත්කම්** | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 3 | 10,344,359 | 10,497,255 | 10,307,573 | 10,447,832 |
| අස්පෘශ්‍ය වත්කම් | 4 | 18,333 | 20,167 | - | - |
| පරිපාලිතයන්හි ආයෝජන | 5 | - | - | 31,320 | 56,321 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 6 | 4,255,147 | 5,670,000 | 4,302,232 | 5,717,086 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **14,617,839** | **16,187,421** | **14,641,125** | **16,221,239** |
| | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| ඉන්වෙන්ට්‍රි | 7 | 910,839 | 1,068,873 | 807,060 | 840,689 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ | 8 | 2,886,543 | 2,743,047 | 2,917,056 | 2,750,425 |
| වෙනත් මූල්‍ය වත්කම් | 6 | 3,351,060 | 351,817 | 3,351,060 | 351,337 |
| මුදල් හා බැංකු ශේෂ | 23 | 3,670,689 | 2,595,684 | 3,509,488 | 2,549,060 |
| **මුළු ජංගම වත්කම්** | | **10,819,131** | **6,759,422** | **10,584,664** | **6,491,511** |
| **මුළු වත්කම්** | | **25,436,970** | **22,946,843** | **25,225,789** | **22,712,751** |
| | | | | | |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **හිමිකම් හා සංචිත** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 9 | 1,145,067 | 1,145,067 | 1,145,067 | 1,145,067 |
| හිමිකම් පිළිබඳ වෙනත් සංරචක | 10 | 1,577,874 | 1,577,874 | 1,552,873 | 1,577,874 |
| රඳවාගත් ඉපැයීම් | | 12,642,634 | 12,533,317 | 12,528,503 | 12,432,117 |
| **මව් සමාගමේ හිමිකම් අයිතිකරුවන් සඳහා ආරෝපණය කළ යුතු හිමිකම්** | | **15,365,575** | **15,256,258** | **15,226,443** | **15,155,057** |
| පාලනය නොවන පොලී | | 56,125 | 44,142 | - | - |
| **මුළු හිමිකම්** | | **15,421,700** | **15,300,400** | **15,226,443** | **15,155,057** |
| | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් | 11 | - | 55,169 | - | 55,169 |
| විලම්බිත බදු වගකීම | 12 | 180,069 | 395,465 | 225,436 | 441,217 |
| පාරිභෝගික දායකය මත විලම්බිත ආදායම | 13 | 3,254,818 | 3,076,840 | 3,254,818 | 3,076,840 |
| සේවක විශ්‍රාම ප්‍රතිලාභ | 14 | 493,687 | 418,569 | 493,311 | 418,277 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **3,928,575** | **3,946,042** | **3,973,565** | **3,991,503** |
| | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ | 15 | 5,800,080 | 2,554,959 | 5,702,547 | 2,422,472 |
| ආදායම් බදු වගකීම | | 215,157 | 1,022,006 | 251,777 | 1,020,921 |
| පොලී සහිත ණය ගැනීම්වල වර්තමාන කොටස | 11 | 71,457 | 123,436 | 71,457 | 122,798 |
| **මුළු ජංගම වගකීම්** | | **6,086,694** | **3,700,401** | **6,025,780** | **3,566,192** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **25,436,970** | **22,946,843** | **25,225,789** | **22,712,751** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල බවට මම සහතික කරමි.

..................................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

..................................................
අධ්‍යක්ෂ

..................................................
අධ්‍යක්ෂ

මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු 29ක, ආකෘති 58කින් ඇත.
2014 මාර්තු 14, කොළඹ

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම සහ එහි පරිපාලිතයන් සඳහා

# මුළු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | 2013 රු.'000 | 2012 රු.'000 | 2013 රු.'000 | 2012 රු.'000 |
| ආදායම | 16 | 22,373,120 | 19,761,169 | 21,660,450 | 18,941,440 |
| විකුණුම් පිරිවැය | | (19,558,568) | (15,861,250) | (18,899,615) | (15,148,014) |
| **දළ ලාභය** | | **2,814,553** | **3,899,920** | **2,760,835** | **3,793,426** |
| වෙනත් මෙහෙයුම් ආදායම | 17 | 580,494 | 462,253 | 570,343 | 454,958 |
| මෙහෙයුම් වියදම් | | (1,728,855) | (1,668,374) | (1,722,344) | (1,631,384) |
| පරිපාලන වියදම් | | (1,465,025) | (1,465,572) | (1,427,739) | (1,402,574) |
| මූල්‍ය ආදායම | 18 | 1,451,314 | 1,213,185 | 1,439,533 | 1,210,811 |
| මූල්‍ය පිරිවැය | 19 | (17,028) | (26,062) | (16,980) | (26,062) |
| **ඒකාකාරී ජාතික ගාස්තු ක්‍රමය - (UNT) හා බදුවලට පෙර ලාභය** | **20** | **1,635,453** | **2,415,351** | **1,603,648** | **2,399,175** |
| ඒකාකාරී ජාතික ගාස්තු ක්‍රමයට (UNT) ගැලපීම | | (1,692,995) | - | (1,692,995) | - |
| **බදුවලට පෙර ලාභය** | | **(57,542)** | **2,415,351** | **(89,347)** | **2,399,175** |
| ආදායම් බදු වියදම | 21 | 150,699 | (627,319) | 155,728 | (625,120) |
| විලම්බිත බදු ගාස්තු /(පිළිවැරීම) | 21.2 | 215,396 | 215,949 | 215,782 | 170,300 |
| **වර්ෂය සඳහා ලාභය/(පාඩුව)** | | **308,553** | **2,003,981** | **282,163** | **1,944,355** |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | | | |
| මූල්‍ය වත්කම් විකිණීමෙන් ශුද්ධ ලාභය/(පාඩුව) | | - | - | (25,001) | - |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(පාඩුව) | | (14,016) | - | (14,016) | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **294,537** | **2,003,981** | **243,146** | **1,944,355** |
| **ආරෝපණය වන්නේ** | | | | | |
| මව් සමාගමේ හිමිකම් අයිතිකරුවන් | | 295,093 | 1,994,255 | | |
| සුළු කොටස් හිමියන්ගේ අයිතිය | | 13,460 | 9,726 | | |
| | | **308,553** | **2,003,981** | | |
| කොටසකට මූලික ඉපැයුම/(පාඩුව) | 22 | | | 2.12 | 16.98 |

මූල්‍ය ප්‍රකාශනවලට කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු 29ක ආකෘති 58කින් ඇත.

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම සහ එහි පරිපාලිතයන් සඳහා

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

**සමූහය**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.'000 | ආදායම් සංචිත රු.'000 | රඳවාගත් ඉපැයීම් රු.'000 | ප්‍රත්‍යාගණන සංචිත රු.'000 | එකතුව රු.'000 | පාලනය නොවන පොලී රු.'000 | මුළු හිමිකම් රු.'000 |
|---|---|---|---|---|---|---|---|
| **2012 ජනවාරි 01ට ශේෂය** | **1,145,067** | **449,900** | **10,710,822** | **1,127,974** | **13,433,763** | **37,423** | **13,471,186** |
| වර්ෂය සඳහා ලාභය | - | - | 1,994,255 | - | 1,994,255 | 9,726 | 2,003,981 |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | - | - | - | - | - |
| **මුළු විස්තීර්ණ ආදායම** | **-** | **-** | **1,994,255** | **-** | **1,994,255** | **9,726** | **2,003,981** |
| ලාභාංශ ගෙවීම | - | - | (171,760) | - | (171,760) | (3,007) | (174,767) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,145,067** | **449,900** | **12,533,317** | **1,127,974** | **15,256,258** | **44,142** | **15,300,400** |
| වර්ෂය සඳහා ලාභය | - | - | 295,093 | - | 295,093 | 13,460 | 308,553 |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | (14,016) | - | (14,016) | - | (14,016) |
| **මුළු විස්තීර්ණ ආදායම** | **-** | **-** | **281,077** | **-** | **281,077** | **13,460** | **294,537** |
| ලාභාංශ ගෙවීම | - | - | (171,760) | - | (171,760) | (1,476) | (173,236) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,145,067** | **449,900** | **12,642,634** | **1,127,974** | **15,365,575** | **56,125** | **15,421,701** |

**සමාගම**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.'000 | ආදායම් සංචිත රු.'000 | රඳවාගත් ඉපැයීම් රු.'000 | විකුණුම් සංචිත සඳහා ශේෂ රු.'000 | ප්‍රත්‍යාගණන සංචිතය රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|---|---|
| 2012 ජනවාරි 01ට ශේෂය | 1,145,067 | 449,900 | 10,660,336 | - | 1,127,974 | 13,383,277 |
| වර්ෂය සඳහා ලාභය | - | - | 1,944,355 | - | - | 1,944,355 |
| සැපයුම් යටිතල ඉවත් කිරීම | - | - | (813) | - | - | (813) |
| **මුළු විස්තීර්ණ ආදායම** | **-** | **-** | **1,943,542** | **-** | **-** | **1,943,542** |
| ලාභාංශ ගෙවීම | - | - | (171,760) | - | - | (171,760) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,145,067** | **449,900** | **12,432,117** | **-** | **1,127,974** | **15,155,058** |
| වර්ෂය සඳහා ලාභය | - | - | 282,163 | - | - | 282,163 |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | (14,016) | (25,001) | - | (39,017) |
| **මුළු විස්තීර්ණ ආදායම** | **-** | **-** | **268,147** | **(25,001)** | **-** | **243,146** |
| ලාභාංශ ගෙවීම | - | - | (171,760) | - | - | (171,760) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,145,067** | **449,900** | **12,528,503** | **(25,001)** | **1,127,974** | **15,226,443** |

මුල්‍ය ප්‍රකාශනවලට කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු 29ක ආකෘති 58කින් ඇත.

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම සහ එහි පරිපාලිතයන් සඳහා

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | සටහන | සමූහය 2013 රු.'000 | සමූහය 2012 රු.'000 | සමාගම 2013 රු.'000 | සමාගම 2012 රු.'000 |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින්/(යෙදූ) මුදල් ප්‍රවාහය** | | | | | |
| බදුවලට පෙර ලාභය/(පාඩුව) | | (57,542) | 2,415,351 | (89,347) | 2,399,175 |
| **ගැලපීම්** | | | | | |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය | 3 | 848,257 | 831,771 | 836,057 | 820,434 |
| ස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ක්‍රමක්ෂය | | 1,881 | 1,881 | - | - |
| මුල්‍ය ආදායම | 18 | (1,451,314) | (1,213,185) | (1,439,533) | (1,210,811) |
| දේපල, පිරියත හා උපකරණ විකිණීම මත ලාභය | 16 | (20,760) | (13,930) | (20,760) | (13,930) |
| මුල්‍ය පිරිවැය | 19 | 17,028 | 26,062 | 16,981 | 26,062 |
| පාරිභෝගික දායකය පිළිබඳ ක්‍රමක්ෂය | 16 | (266,804) | (135,661) | (266,804) | (135,661) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන | 13 | 71,134 | 66,126 | 69,732 | 66,107 |
| **කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)** | | **(858,120)** | **1,978,414** | **(893,675)** | **1,951,375** |
| ඉන්වෙන්ට්‍රි (වැඩිවීම)/අඩුවීම | | 158,035 | (248,766) | 33,630 | (242,663) |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ (වැඩිවීම)/අඩුවීම | | (143,496) | (1,132,625) | (166,631) | (1,151,966) |
| වෙනත් මුල්‍ය වත්කම් (වැඩිවීම)/අඩුවීම | | (2,999,243) | 24,098 | (2,999,723) | 19,960 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ (වැඩිවීම)/අඩුවීම | | 3,245,121 | 138,131 | 3,280,075 | 199,368 |
| **මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්** | | **(597,703)** | **759,252** | **(746,325)** | **776,074** |
| ගෙවූ පොලී | | (17,028) | (26,062) | (16,981) | (26,062) |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම (පිරිවැය) | | (10,032) | (14,905) | (8,713) | (14,905) |
| ගෙවූ ආදායම් බදු | | (656,150) | (644,745) | (613,416) | (640,708) |
| ගෙවූ මුද්දර ගාස්තු | | - | (150) | - | - |
| **මෙහෙයුම් කටයුතුවලින්/(යෙදූ) ශුද්ධ මුදල්** | | **(1,280,913)** | **73,389** | **(1,385,434)** | **94,398** |
| **ආයෝජන කටයුතුවලින්/(යෙදූ) මුදල් ප්‍රවාහය** | | | | | |
| දේපල, පිරියත හා උපකරණ ශුද්ධ අත්කර ගැනීම හා අපහරණය | | (674,646) | (601,170) | (675,036) | (592,301) |
| ජංගම නොවන වෙනත් ආයෝජනවල ආයෝජන/(අයකර ගැනීම්) | | 1,414,853 | (2,968,000) | 1,414,853 | (2,968,000) |
| පරිපාලිතයන්හි ආයෝජන | | - | - | - | (25,000) |
| ලැබුණු පොලී | | 1,451,314 | 1,213,185 | 1,439,533 | 1,210,811 |
| ලැබුණු පාරිභෝගික දායකය | | 444,782 | 425,079 | 444,782 | 425,079 |
| **ආයෝජන කටයුතුවලින්/(යෙදූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **2,636,303** | **(1,930,906)** | **2,624,133** | **(1,949,410)** |
| **මුල්‍ය කටයුතුවලින්/(යෙදූ) මුදල් ප්‍රවාහය** | | | | | |
| ලාභාංශ ගෙවීම | | (173,236) | (174,767) | (171,760) | (171,760) |
| සාමාන්‍ය කොටස් නිකුතුව | | - | - | - | - |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් ආපසු ගෙවීම් | 10 | (76,566) | (77,422) | (76,566) | (77,422) |
| **මුල්‍ය කටයුතුවලින්/(යෙදූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(249,802)** | **(252,189)** | **(248,326)** | **(249,182)** |
| **මුදල් හා මුදල් සමාන ශේෂයේ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **1,105,588** | **(2,109,706)** | **990,372** | **(2,104,195)** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන ශේෂ** | | **2,549,671** | **4,659,377** | **2,503,684** | **4,607,879** |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන ශේෂ** | 23 | **3,655,258** | **2,549,671** | **3,494,057** | **2,503,684** |

මුල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු 29ක ආකෘති 58කින් ඇත.

# අපි

ගනුදෙනුකරු අරමුණු කරගත්
විදුලිබල බෙදාහරින්නකු වශයෙන් අපි
කාලීනව හා සතුටුදායකව එක් එක් සියළු පාරිභෝගිකයන්ට
වැදගත් විසඳුම් ලබාදෙමු.

# ඉටු කරන්නෙමු



# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

## 1. ආයතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය තොරතුරු

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කර පවත්වාගෙන යන සීමිත සමාගමකි. ලියාපදිංචි කාර්යාලය කොළඹ 03, ගාලු පාර, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411 හි පිහිටා ඇත.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ '(සමාගම)' ගිණුම් හා එයට ඒකාබද්ධ කරන ලද එහි පරිපාලිතයන්ගේ ගිණුම්වලින් '(සමූහය)' සමන්විත වේ.

### 1.3 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලි බලය මිලදී ගෙන ගාල්ල, කළුතර, මොරටුව, කැලණිය, නුගේගොඩ, කෝට්ටේ හා මීගමුව පිහිටි සමාගමේ ශාඛා මඟින් ගෘහස්ථ හා කර්මාන්ත ගනුදෙනුකරුවන්ට සිල්ලරට බෙදාහැරීමයි.

සමාගමේ පරිපාලිතයන් හා ඒවායේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

| සමාගම | කාර්යය |
|---|---|
| සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම | රට තුළ විදුලි බලය බෙදාහැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමට |
| සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම | ශ්‍රී ලංකාවේ විද්‍යුත් මීටර් අවශ්‍යතාවය සඳහා හා අපනයන වෙළෙඳපොළට සැපයීමට විද්‍යුත් මීටර් නිෂ්පාදනය කිරීමේ පහසුකම ඇති කිරීම සඳහා |

### 1.4 මව් ව්‍යාපාරය හා මූලික මව් ව්‍යාපාරය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ සංස්ථාපනය කරන ලද ලංකා විදුලිබල මණ්ඩලය සමාගමේ මව් ව්‍යාපාරයයි.

### 1.5 නිකුත් කිරීම සඳහා අනුමත දිනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, 2014 මාර්තු 14 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුකූලව නිකුත් කිරීම සඳහා අනුමැතිය ලැබී තිබුණි.

## 2. පොදු ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් (මින්පසු ශ්‍රී ලංමූ.වා.ප්‍ර ලෙස සැලකෙන) සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී.

සමූහයේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කරන ලදී. සමූහයේ ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කරන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර දක්වා ඇති අවස්ථාවකදී හැර සියළු වටිනාකම් ආසන්න රුපියල් දහසට (රු.'000) ගෙන ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව සිදුකර ඇත.

#### 2.1.1 අඛණ්ඩ පැවැත්ම

සමාගම අඛණ්ඩව පවත්වා ගැනීමේ හැකියාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමක් කර ඇති අතර වෙළෙඳ ව්‍යාපාරය අවසන් කිරීමට හෝ නැවැත්වීමට ඔවුන් අදහස් නොකරයි.

#### 2.1.2 ඒකාබද්ධ කිරීමේ පදනම

වාර්තා කරන දිනයට සමූහයේ හා එහි පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශනවලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ.

පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන, මව් සමාගම මෙන් එකම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් සඳහා හා විශේෂිතව සඳහන් කරන ලද අවස්ථාවකදී හැර සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව පිළියෙල කර ඇත.

අන්තර්-සමූහ ගනුදෙනුවලින් ඇතිවන සියළු අන්තර්-සමූහ ශේෂ හා ආදායම් හා වියදම් සහ උපලබ්ධි නොවූ ලාභ/පාඩු සම්පූර්ණයෙන් ඉවත් කර ඇත.

සමූහය විසින් පාලනය ලබාගත් දිනය වශයෙන්, අත්කරගත් දිනයේ සිට පරිපාලිතයන් සම්පූර්ණයෙන් ඒකාබද්ධ කරන ලද අතර එම පාලනය අවසන් වන දිනය දක්වා ඒකාබද්ධ කිරීම අඛණ්ඩව පවත්වා ගනු ලැබේ. අනුරූප ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනිමින් මව් සමාගම මෙන් එකම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් සඳහා පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. අන්තර්-සමූහ ගනුදෙනුවලින් ඇතිවන සියළු අන්තර්-සමූහ ශේෂ, ගනුදෙනු, උපලබ්ධි නොවූ ලාභ, පාඩු සහ ලාභාංශ සම්පූර්ණයෙන් ඉවත් කරනු ලැබේ.

පරිපාලිතයක් තුළ ඇතිවන පාඩු එය ඌනතා ශේෂයක් වුවද පාලනය කළ නොහැකි ලාභයක් සඳහා ආරෝපණය කරනු ලැබේ.

පාලනය පිළිබඳ පාඩුවක් නොමැතිව පරිපාලිතයක අයිතිය පිළිබඳ වෙනස්වීමක් හිමිකම් ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ. පරිපාලිතයක පාලනය පිළිබඳව සමූහයට පාලනයක් නොමැති වූ විට,

- පරිපාලිතයේ වත්කම් (කීර්තිනාමය ඇතුළත්ව) සහ වගකීම් හඳුනා නොගනී.
- යම් පාලනය නොවන ලාභයක් පිළිබඳ ධාරණ අගය හඳුනා නොගනී
- හිමිකම් වාර්තාකරණයේ සමුච්චිත පරිවර්තන වෙනස්කම් හඳුනා නොගනී
- ලැබුණු ප්‍රතිඵලය පිළිබඳ සාධාරණ අගය හඳුනා ගනී
- යම් රඳවාගත් ආයෝජනයක සාධාරණ අගය හඳුනා ගනී
- ලාභයේ හෝ පාඩුවේ යම් අතිරික්තයක් හෝ ඌනතාවයක් හඳුනා ගනී
- ලාභය හෝ පාඩුව හෝ රඳවාගත් ඉපැයුම් සඳහා වෙනත් විස්තීර්ණ ආදායමෙහි පෙර හඳුනා ගත් මව් සමාගමේ සංරචකයන්හි අයිතිය අදාළ පරිදි යළි වර්ග කෙරේ

පහත සඳහන් සමාගම් ඒකාබද්ධ කරන ලදී.

සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම

සීමාසහිත ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම

## 2.2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 2.2.1 ආදායම හඳුනාගැනීම

අපේක්ෂා කළ හැකි යම් දුරකට සමූහයට ගලායන ආර්ථික ප්‍රතිලාභ සහ විශ්වාසවත්ව මිණිය හැකි ආදායම හඳුනා ගැනේ. ගෙවීම් කරන අවස්ථාව සැලකිල්ලට නොගෙන ආදායම වෙළෙඳ වට්ටම් හා බදු හැර ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාව පිළිබඳ සාධාරණ අගයට ආදායම මිණීම සිදුකෙරේ.

ආදායම හඳුනා ගැනීමට පෙර පහත සඳහන් විශේෂිත නිර්ණායකයන් ද එකතු වේ.

**(අ) භාණ්ඩ විකිණීම**

සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදාහැරීමකදී භාණ්ඩවල අයිතිය පිළිබඳ සැලකිය යුතු අවදානම හා ප්‍රතිඵලය මිලදී ගන්නා වෙත යන විට භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම ලෙස හඳුනා ගැනේ.

**(ආ) සේවා සැපයීම**

සේවා සැපයීමෙන් ලැබෙන ආදායම සේවා සැපයීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ ගිණුම් කාලපරිච්ඡේදයේදී හඳුනා ගනු ලැබේ.

**(ඇ) පොලී ආදායම**

සියළු මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට මිණීම් කරන අතර විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති පොලී සහිත මූල්‍ය වත්කම්, පොලී ආදායම/හෝ වියදම, මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ජීව කාලය හෝ කෙටි කාල පරිච්ජේදයක් මඟින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හා ලැබීම් නිශ්චිතවම වට්ටම් කරන අනුපාතය වන ඵලදායි පොලී අනුපාතය (EIR) යොදා ගනිමින් මූල්‍ය වත්කමේ හෝ වගකීමේ ධාරණ අගය සඳහා අදාළ පරිදි වාර්තා කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම තුළ පොලී ආදායම ඇතුළත් කර ඇත.

**(ඈ) ලාභාංශ**

ස්ථාපිත ගෙවීම ලැබීම සඳහා සමූහයේ හිමිකම ඇතිවිට එම ආදායම හඳුනා ගනු ලැබේ.

**(ඉ) වෙනත්**

වෙනත් ආදායම උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

### 2.2.2 විදේශ වලංගු මුදල්

මව් සමාගමේ ද ක්‍රියාත්මක වන වලංගු මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ. එක් එක් ආයතනයක් සඳහා ක්‍රියාත්මක වලංගු මුදල් ඒකකය සමූහය විසින් තීරණය කරනු ලබන අතර එක් එක් ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතමයන් ක්‍රියාත්මක වලංගු මුදල් ඒකකය යොදා ගනිමින් මනිනු ලැබේ. ඒකාබද්ධ කිරීම සඳහා සමූහය විසින් සෘජු ක්‍රමය යොදා ගන්නා අතර මෙම ක්‍රමය මඟින් පැන නගින ලාභය හෝ පාඩුව යළි සකස් කිරීම සඳහා තෝරා ගැනේ.

**(අ) ගනුදෙනු හා ශේෂ**

ගනුදෙනු සිදුකරන දිනට පවත්නා ක්‍රියාත්මක වලංගු මුදල් අනුපාතයට, සමාගම විසින් විදේශ වලංගු මුදල් ගනුදෙනු ආරම්භකව වාර්තා කරනු ලැබේ.

විදේශ වලංගු මුදල් ඒකකවලින් දක්වා තිබූ මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කෙරෙන දිනයට පවත්නා ක්‍රියාත්මක වලංගු මුදල් අත්පිට හුවමාරු අනුපාතයට යළි පරිවර්තනය කරනු ලැබේ.

විදේශ කාර්යයක ශුද්ධ ආයෝජනයක කොටසක් ලෙස සැදුණු සියළු මූල්‍ය අයිතමයන් බැහැර කර සියළු වෙනස්කම් ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. ඒවා ලාභයට හෝ පාඩුවට යළි වර්ගකරන විට ශුද්ධ ආයෝජනය අපහරණය වනතුරු ඒවා වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ. එම මූල්‍ය විෂයයන් මත හුවමාරු වෙනස්කම් සඳහා ආරෝපණය වන බදු ගාස්තු හා බැර ද වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තා කරනු ලැබේ.

විදේශ වලංගු මුදලක ඓතිහාසික පිරිවැය ප්‍රකාරව මනිනු ලබන මුදල් නොවන අයිතමයන් ආරම්භක ගනුදෙනු දිනයන්හි පැවතුණු හුවමාරු අනුපාතය යොදා ගනිමින් පරිවර්තනය කරනු ලැබේ. විදේශ වලංගු මුදලක සාධාරණ වටිනාකමට මනිනු ලබන මුදල් නොවන විෂයයන්, සාධාරණ අගය තීරණය කරන ලද දිනයේ පැවති හුවමාරු අනුපාතය යොදාගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

මුදල් නොවන විෂයයන් පරිවර්තනය කිරීම මත පැන නගින ලාභය හෝ පාඩුව පරිවර්තන වෙනස පැනනැගීම සඳහා වූ ලාභය හෝ පාඩුවට අනුකූලව හඳුනාගනු ලැබේ. (වෙනත් විස්තීර්ණ ආදායමේ හෝ ලාභයේ හෝ පාඩුවේදී හඳුනාගන්නා ලද ලාභ හෝ පාඩු අයිතමයන් මත පරිවර්තන වෙනස්කම් පිළිවෙළින් වෙනත් විස්තීර්ණ ආදායම් හි හෝ ලාභය හෝ පාඩුවෙහි ද හඳුනා ගැනේ)

### 2.2.3 බදුකරණය

**(අ) ප්‍රවර්ථන බදු**

ප්‍රවර්ථන හා පෙර කාලපරිච්ඡේද සඳහා ප්‍රවර්ථන ආදායම් බදු වත්කම් හා වගකීම් අයකරගත යුතු හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවිය යුතු අපේක්ෂිත මුදලට මනිනු ලැබේ. බදු මුදල ගණනය කිරීම සඳහා යොදා ගන්නා බදු අනුපාත හා බදු නීති, සමාගම ක්‍රියාත්මක වන හා බදු ආදායම උත්පාදනය වන රටෙහි වාර්තාකරණ දිනයට පනවන ලද හෝ ස්ථිර ලෙස පනවන ලද ඒවා වේ. හිමිකම් හි සෘජුවම හඳුනාගන්නා විෂයයන් සම්බන්ධයෙන් ප්‍රවර්ථන ආදායම් බදු හිමිකම් හි හඳුනාගැනෙන අතර එය ආදායම් ප්‍රකාශනයේ හඳුනා නොගැනේ.

මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකරණ ලද පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය ආදායම හා වියදම යන මූලිකාංග මත පදනම් වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා එයට කරන ලද සංශෝධනවල විධිවිධානවලට අනුකූල වන පරිදි ගණනය කෙරේ.

**(ආ) විලම්බිත බදුකරණය**

මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා වගකීම් ක්‍රමය යොදා ගනිමින් වත්කම් හා වගකීම්හි බදු පදනම් අතර වාර්තාකරණ දිනයට ඇති සියළු තාවකාලික වෙනස්කම් සහ එහි ධාරණ අගයන් මත විලම්බිත බදු සඳහා ප්‍රතිපාදනය කෙරේ.

සියළු බදු ගෙවිය යුතු තාවකාලික වෙනස්කම් සඳහා පහත කරුණු හැර විලම්බිත ආදායම් බදු වගකීම් හඳුනාගනු ලැබේ:

(i) ව්‍යාපාර එකතුවක් නොවන ගනුදෙනුවකදී වත්කමක හෝ වගකීමක මුල් හඳුනාගැනීමෙන් විලම්බිත බදු බැරකම් පැන නගින විට සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභය හෝ බදු ගෙවිය යුතු ලාභය හෝ පාඩුවට බලනොපාන විට: සහ

(ii) පාලනය කළ හැකි තාවකාලික වෙනස්කම් පිළිබඳ පිළිවැරීම් කාලය සහ දැන ගන්නා අනාගතයේදී ප්‍රතිවර්තනය කළ නොහැකි තාවකාලික වෙනස්කම් හැර පරිපාලිතයන්හි, ආශ්‍රිතයන්හි ආයෝජනයන් සහ බද්ධ ව්‍යාපාරයන්හි අයිතින් ආශ්‍රිතව වන තාවකාලික බදු වෙනස්කම් සම්බන්ධයෙන්

විලම්බිත ආදායම් බදු වත්කම්, සියළු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන යන භාවිත නොකළ බදු බැර හා භාවිත නොකළ බදු පාඩු සඳහා අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්වලට එරෙහිව තිබෙන බදු ලාභය යම්තාක් දුරට හඳුනාගනු ලබන අතර භාවිත නොකළ බදු බැර හා භාවිත නොකළ බදු පාඩු ඉදිරියට ගෙනයාම පහත සඳහන් අවස්ථාවලදී හැර උපයෝජනය කළ හැක:

(i) ව්‍යාපාර එකතුවක් නොවන ගනුදෙනුවකදී, වත්කමක හෝ වගකීමක ආරම්භක හඳුනාගැනීමකින් පැන නගින අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත ආදායම් බදු වත්කමක් ඇති විට සහ ගනුදෙනු අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු සහිත ලාභයට හෝ පාඩුවට බලනොපාන විට: සහ

(ii) පරිපාලිතයන්හි, ආශ්‍රිතයන්හි ආයෝජනයන් සහ බද්ධ ව්‍යාපාර අයිතීන් සම්බන්ධිත අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් අනාගතයේ ප්‍රතිවර්තනය වන තාවකාලික වෙනස්කම් සිදුවිය හැකි වන විලම්බිත බදු වත්කම් යම් දුරකට හඳුනා ගනු ලබන අතර උපයෝජනය කළ හැකි තාවකාලික වෙනස්කම්වලට එරෙහිව බදු ගෙවිය යුතු ලාභය ලැබේ.

විලම්බිත ආදායම් බදු වත්කම් පිළිබඳ ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කෙරෙන අතර තවදුරටත් විය හැකි නොවන ප්‍රමාණවත් බදු අය කළ යුතු ලාභයක් තිබිය හැකි බවට උපයෝජනය කළ යුතු විලම්බිත ආදායම් බදු සියල්ලම හෝ කොටසක් ඉඩදීම සඳහා යම් දුරකට අඩු කෙරේ.

හඳුනානොගත් ප්‍රමාද කළ බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයට යළි තක්සේරු කරන අතර, අය කළ යුතු විලම්බිත බදු වත්කම් අනුමත කෙරෙන අනාගත බදු අය කළ යුතු ලාභ විය හැකි දුරකට හඳුනාගනු ලැබේ.

විලම්බිත ආදායම් බදු වත්කම් හා වගකීම්, වත්කම් උපලබ්ධි වූ විට හෝ වගකීම නිරවුල් කළ විට, වාර්තාකරණ දිනයට පනවන ලද හෝ ස්ථිර වශයෙන් පනවන ලද බදු අනුපාතයන් (සහ බදු නීති) පදනම් කර ගෙන, වර්ෂයට අදාළ කර ගැනීම සඳහා අපේක්ෂිත, බදු අනුපාතයන්ට මනිනු ලැබේ.

විෂයයන් සම්බන්ධයෙන් විලම්බිත බදු, වෙනත් විස්තීර්ණ ආදායමේ හෝ සෘජුවම ස්කන්ධයෙහි අවධාරණය කරන ගනුදෙනුව සඳහා සහසම්බන්ධයෙහි හඳුනා ගනු ලැබේ.

ප්‍රවර්ථන බදු වගකීමට එරෙහිව ප්‍රවර්ථන බදු වත්කම් හිලව් කිරීම සඳහා නෛතිකව බලගැන්වූ හිමිකමක් වේ නම් හා එකම බදු අය කළ යුතු ආයතනය හා එකම බදු අය කෙරෙන අධිකාරිය සම්බන්ධයෙන් විලම්බිත බදු අදාළ වේ නම් විලම්බිත බදු වත්කම් හා විලම්බිත බදු වගකීම්, හිලව් කෙරේ.

**(ඇ) ලාභාංශ ආදායම මත බදු**

පරිපාලිතයන්ගෙන් ලැබෙන ලාභාංශ ආදායම මත බදු ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 2.2.4 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිරිවැයට, සමුච්චිත ක්ෂය අඩු ශුද්ධ අගයට සහ/හෝ සමුච්චිත හානිකරණ පාඩු තිබේ නම් ඒවා ද ප්‍රකාශ කරනු ලැබේ. එවැනි පිරිවැය තුළ දේපල, පිරියත හා උපකරණ සඳහා ආදේශ කරන සංරචක කොටස් පිරිවැය හා දිගුකාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීම් පිරිවැය ද හඳුනා ගැනීම් නිර්නායකය තිබේ නම් ඇතුළත් වේ. අන්තර් කාලවලදී දේපල, පිරියත හා උපකරණවල වැදගත් කොටස් ආදේශ කළ යුතු වූ විට ආදේශ කරන කොටසේ ශුද්ධ පොත් අගය සමාගම හඳුනා නොගන්නා අතර නව කොටස එහි සම්බන්ධිත ප්‍රයෝජනවත් ජීව කාලය හා ක්ෂය සමඟ හඳුනා ගනී. එසේම ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරන විට, හඳුනා ගැනීම් නිර්ණායකය සතුටුදායක වේ නම් ආදේශ කිරීමක් ලෙස එහි පිරිවැය පිරියත හා උපකරණවල ධාරණ අගයෙහි හඳුනාගනු ලැබේ. අනිකුත් සියළු අළුත්වැඩියා හා නඩත්තු පිරිවැය දරන ලද පරිදි ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ අයිතමයන් පසුව ප්‍රත්‍යාගණනය කිරීමකදී, එම සම්පූර්ණ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. වැඩිවීම ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගන්නා අවස්ථාවකදී ආදායම් ප්‍රකාශනයේ පෙර හඳුනා ගන්නා ලද එම වත්කමේම ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය වන යම් දුරකට හැර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ වෙනත් විස්තීර්ණ ආදායම හා සමුච්චිත හිමිකම් හි ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් හඳුනා ගැනේ. වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ හඳුනාගත් එකම වත්කම මත පවත්නා අතිරික්තය හිලව් වන යම් දුරකට හැර ප්‍රත්‍යාගණන ඌනතාවයක් ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

ප්‍රත්‍යාගණන දිනයට වන සමුච්චිත ක්ෂය, වත්කමේ දළ ධාරණ අගයට එරෙහිව ඉවත් කරන අතර වත්කමේ ප්‍රත්‍යාගණන අගයට ශුද්ධ මුදල යළි දක්වනු ලැබේ. අපහරණයකදී, එම විශේෂිත වත්කම විකිණීම් වශයෙන් අදාළ යම් ප්‍රත්‍යාගණන සංචිතයක් වේ නම් රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ.

සියළු දේපල, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය මත, සරල මාර්ග ක්‍රමය මත පදනම්ව ක්ෂය ගණනය කරනු ලැබේ.

සමූහය විසින් යොදා ගන්නා ප්‍රධාන වාර්ෂික ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 2.5% |
| **යටිතල සැපයීම** | |
| පළාත් පාලන ආයතනවලින් හා ලංකා විදුලිබල මණ්ඩලයෙන් භාර ගන්නා ලද උප මධ්‍යස්ථාන, ඉහළ විදුලි රැහැන් සහ සේවා රැහැන් | 10% |
| සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් ඉදිකරන ලද උප මධ්‍යස්ථාන, ඉහළ විදුලි රැහැන් හා සේවා රැහැන් | 4% - 5% |
| මෝටර් වාහන | 15% |
| පරිගණක | 20% |
| කාර්යාල උපකරණ | 15% |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 25% |

ආරම්භකව හඳුනාගන්නා ලද දේපල, පිරියත හා උපකරණ විෂයයක් සහ ඕනෑම වැදගත් කොටසක්, අපහරණයකදී හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ එහි භාවිතයෙන් හෝ අපහරණයේදී අපේක්ෂා නොකරන විටකදී හඳුනා නොගැනේ. වත්කම හඳුනා නොගැනීම මත පැන නගින ඕනෑම ලාභයක් හෝ පාඩුවක් (ශුද්ධ අපහරණයෙන් ලැබුණු මුදල හා වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම හඳුනා නොගන්නා විට ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ.

### 2.2.5 කල්බදු

වැඩ පිළිවෙළක් හෝ අඩංගු වන කරුණු ද යන තීරණය අනුව ආරම්භක දිනයට වැඩ පිළිවෙළේ අර්ථය මත කල්බදු පදනම් වේ. විශේෂිත වත්කමක හෝ වත්කම් භාවිතය මත වැඩ පිළිවෙළ ඉටුකරගැනීම සඳහා යැපෙන්නේ ද හෝ වත්කම හෝ වත්කම් භාවිත කිරීමේ අයිතිය වැඩ පිළිවෙළ ගෙන එන්නේ ද යන්න සඳහා අයිතිය වැඩ පිළිවෙළෙහි විශේෂිතව ප්‍රකාශ නොවුව ද වැඩ පිළිවෙළ තක්සේරු කරනු ලැබේ.

**මෙහෙයුම් කල්බදු**

බදු කාලය මත සරල මාර්ග ක්‍රමය පදනම්ව මෙහෙයුම් කල්බදු ගෙවීම් ආදායම් ප්‍රකාශනයේ මෙහෙයුම් වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 2.2.6 ණයගැනීම් පිරිවැය

වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය සඳහා ණය ගැනීම් පිරිවැය සෘජුවම හඳුනාගත හැකි වන අතර එයින් අදහස් කළ භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වන සැලකිය යුතු කාලපරිච්ඡේදයක් අත්‍යවශ්‍යයෙන්ම ගන්නා අදාළ වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ. වෙනත් සියළු ණය ගැනීම් පිරිවැය එය සිදුවන කාල පරිච්ඡේදයේදී වැය කරනු ලැබේ. ණය ගැනීම් පිරිවැය, පොලිය හා අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් ආයතනයක් දරන වෙනත් පිරිවැයවලින් සමන්විත වේ.

### 2.2.7 ස්පෘශ්‍ය වත්කම්

වෙනම අත්පත් කර ගත් ස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනීම මත පිරිවැයට මනිනු ලැබේ. ව්‍යාපාර එකතුවකදී අත්පත් කර ගත් ස්පෘශ්‍ය වත්කම් පිළිබඳ පිරිවැය අත්පත් කර ගන්නා දිනයට පැවති ඒවායේ සාධාරණ අගය වේ. ආරම්භක හඳුනා ගැනීම අනුව ස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය අඩු පිරිවැයට සහ සමුච්චිත හානිකරණ පාඩු ඇත්නම් එයට ධාරණය කරනු ලැබේ. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තරිකව උත්පාදනය වන ස්පෘශ්‍ය වත්කම්, ප්‍රාග්ධනිත නොකෙරෙන අතර වියදම දරන ලද වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ නිරූපණය වේ.

ස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය සීමිත හෝ අසීමිත ලෙස තක්සේරු කරනු ලැබේ.

සීමිත ජීව කාලයක් ඇති ස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ආර්ථික ජීව කාලය මත ක්‍රමක්ෂය කරනු ලබන අතර ස්පෘශ්‍ය වත්කම හානිකරණය වීමේ ඇඟවීමක් වේ නම් හානිකරණය සඳහා තක්සේරු කෙරේ. සීමිත ප්‍රයෝජනවත් ජීව කාලයක් ඇති ස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය සහ ක්‍රමක්ෂය ක්‍රමය අවම වශයෙන් එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. වත්කමේ අන්තර්ගත වන අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය පිළිබඳ අපේක්ෂිත රටාවේ වෙනස්කම් අදාළ පරිදි, ක්‍රමක්ෂය කාල පරිච්ඡේදය හෝ ක්‍රමය වෙනස් කිරීම මඟින් ගිණුම්ගත කෙරෙන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කිරීම් ලෙස සලකනු ලැබේ. සීමිත ජීව කාලයක් ඇති ස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම, ආදායම් ප්‍රකාශනයේ ස්පෘශ්‍ය වත්කම් කාර්යය සමඟ අනුරූප වියදම් වර්ගයේ හඳුනා ගනු ලැබේ.

අසීමිත ප්‍රයෝජනවත් ජීව කාලයක් ඇති ස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කරනු නොලබන නමුත් වාර්ෂික හානිකරණය සඳහා තනි තනිව හෝ මුදල් උත්පාදන ඒකක මට්ටමින් පරීක්ෂා කරනු ලැබේ. අසීමිත ජීව කාලය ආධාරකයක් වීම සඳහා පවත්වා ගෙන යන්නේ ද යන්න තීරණය කිරීම සඳහා අසීමිත ජීව කාලය තක්සේරු කිරීම, වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. එසේ නොවේ නම්, ප්‍රයෝජනවත් ජීව කාලය අසීමිත සිට සීමිත ලෙස වෙනස්වීම අපේක්ෂිත පදනමක් මත සිදුකරනු ලැබේ.

ස්පෘශ්‍ය වත්කමක හඳුනා නොගැනීම මත පැන නගින ලාභ හෝ පාඩු, ශුද්ධ අපහරණ ලැබීම් හා වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස මනිනු ලබන අතර වත්කම හඳුනා නොගැනීමේදී ඒවා ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

### 2.2.8 ඉන්වෙන්ට්‍රි

අඩුම පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයට ඉන්වෙන්ට්‍රි අගය කරනු ලැබේ.

එක් එක් නිෂ්පාදිතය එහි වර්තමාන ස්ථානයට ගෙන ඒමේදී දරන ලද පිරිවැය සහ තත්ත්වය පහත පරිදි ගිණුම්ගත කෙරේ.

- භාණ්ඩ මෙහෙයුම් හා නඩත්තු – බර තැබූ සාමාන්‍ය පදනම මත තථ්‍ය පිරිවැයට
- මාර්ගස්ථ බඩු සහ වෙනත් තොග – තථ්‍ය පිරිවැයට

සාමාන්‍ය ව්‍යාපාර කාර්යයකදී, නිම කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය අඩුකිරීමෙන් පසු ශුද්ධ උපලබ්ධි වටිනාකම ඇස්තමේන්තුගත විකුණුම් මිල වේ.

### 2.2.9 මූල්‍ය උපකරණ - ආරම්භක හඳුනාගැනීම සහ පසුව මිනුම්කරණය

### (I) මූල්‍ය වත්කම්

**ආරම්භක හඳුනාගැනීම සහ මිනුම්කරණය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 විෂය පථය තුළ ලාභය හෝ පාඩුව, ණය සහ ලැබිය යුතු ශේෂ, පරිණතවීම් සඳහා ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් මගින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් ලෙස අදාළ පරිදි හා ආරම්භක හඳුනා ගැනීමේදී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය තීරණය කිරීමේදී මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

සියළු මූල්‍ය වත්කම් සාධාරණ අගයට ආරම්භකව හඳුනාගන්නා අතර ආයෝජනයන්හිදී ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නොව සෘජුවම හඳුනාගත හැකි ගනුදෙනු පිරිවැයට හඳුනා ගැනේ.

මූල්‍ය වත්කම් සඳහා මුදල් හා කෙටිකාලීන තැන්පතු, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂ හා වෙනත් මූල්‍ය වත්කම් ඇතුළත් වේ.

**පසුව මිනුම්කරණය**

මූල්‍ය වත්කම් පිළිබඳ පසුව මිනුම්කරණය පහත පරිදි ඒවායේ වර්ගීකරණය මත සිදුවේ.

**ණය සහ ලැබිය යුතු ශේෂ**

ණය සහ ලැබිය යුතු ශේෂ යනු ක්‍රියාකාරී වෙළෙඳපොළක මිල ප්‍රකාශිත නොවන ස්ථාවර හෝ තීරණාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ආරම්භක මිනීමෙන් පසු, එම මූල්‍ය වත්කම් ඵලදායී පොලී අනුපාතය (Effective Interest Rate) යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට, හානිකරණය අඩුකර පසුව මනිනු ලැබේ. අත්කර ගැනීම මත යම් වට්ටමක් හෝ වාරිකයක් හා ඵලදායී පොලී අනුපාතයේ කොටසක් වන ගාස්තු හෝ පිරිවැය ගිණුම්වලට ගැනීම මගින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායී පොලී අනුපාතයේ ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමෙහි ඇතුළත් කරනු ලැබේ. හානිකරණයෙන් පැන නගින පාඩු, ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජනයන්**

විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජනයන් සඳහා ස්කන්ධ හා ණය සුරැකුම්පත් ඇතුළත් වේ. විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති ස්කන්ධ ආයෝජනයන් යනු වෙළෙඳාම සඳහා හෝ ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නිශ්චය නොකෙරෙන ලෙස වර්ග කර ඇති ඒවාය. මෙම වර්ගීකරණයේ ණය සුරැකුම්පත් අසීමිත කාල පරිච්ජේදයක් සඳහා වන හා ද්‍රවශීලතා සඳහා අවශ්‍ය ප්‍රතිචාර ලෙස විකිණෙන හෝ වෙළෙඳපොළ කරුණු වෙනස්වීම සඳහා ප්‍රතිචාර දැක්වෙන ඒවා ලෙස අදහස් කෙරේ.

ආරම්භක මිණීමෙන් පසු, විකිණීමට ඇති මූල්‍ය ආයෝජනයන් පසුව, වෙනත් මෙහෙයුම් ආදායමේ සමුච්චිත ලාභ හෝ පාඩු හඳුනාගන්නා අවස්ථාවේදී හෝ හානිකරණය සඳහා තීරණය කළ විට, මූල්‍ය පිරිවැයෙහි හා ආදායම් ප්‍රකාශනයේ යළි වර්ගීකරණය කරන ලද සමුච්චිත පාඩුව හා විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කර ගන්නා අවස්ථාවේදී ආයෝජනය හඳුනා ගන්නා තෙක් විකිණීමට ඇති සංචිතයෙහි වෙනත් විස්තීර්ණ ආදායම ලෙස උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු සමඟ සාධාරණ අගයට පසුව මනිනු ලැබේ. විකිණීමට ඇති ණය සුරැකුම්පත් මත පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ගණනය කර එය ලාභයෙහි හෝ පාඩුවෙහි හඳුනාගනු ලැබේ.

සමූහය විසින් විකිණීමට ඇති මූල්‍ය වත්කම් අදාළ වන ආසන්න කාලයකදී ඒවායේ විකිණීම සඳහා ඇති හැකියාව හා තීරණය ඇගයීම් කරනු ලැබේ. ක්‍රියාකාරී නොවන වෙළෙඳපොළ හේතුවෙන් මෙම මූල්‍ය වත්කම් වෙළෙඳාම් කිරීමට සමූහයට නොහැකි වූ විට සහ කළමනාකරණයේ අදහස් අනුව සමූහය දුර්ලභ අවස්ථාවන්හි අනාගතයේදී වන සැලකිය යුතු වෙනස්කම් මත මෙම මූල්‍ය වත්කම් යළි වර්ගීකරණය කිරීම සඳහා තෝරා ගනී.

ණය සහ ලැබිය යුතු ශේෂ ලෙස අර්ථ දැක්වෙන මූල්‍ය වත්කම් සහ අනාගත කාලයකට හෝ පරිණතවීම් තෙක් මෙම වත්කම් තබා ගැනීම සඳහා සමූහයට අදහසක් හා හැකියාවක් තිබෙන විට ණය සහ ලැබිය යුතු ශේෂ සඳහා යළි වර්ගීකරණය කිරීමට ඉඩ දෙනු ලැබේ. ඒ අනුව මූල්‍ය වත්කම තබා ගැනීම සඳහා ආයතනයට හැකියාව හා අදහස ඇති විට පමණක් පරිණතවීම් සඳහා තබා ගැනෙන වර්ගය සඳහා යළි වර්ගීකරණයට ඉඩ ලැබේ.

විකිණීම සඳහා ඇති වර්ගයෙන් යළි වර්ගීකරණය කෙරෙන මූල්‍ය වත්කමක් සඳහා හිමිකමේ හඳුනාගත් එම වත්කම මත පෙර ලාභයක් හෝ පාඩුවක් වේ නම්, එය ඵලදායී පොලී අනුපාතය (EIR) යොදා ගනිමින් ආයෝජනයේ ඉතිරි ජීව කාලය මත ලාභයට හෝ පාඩුවට ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර යම් වෙනසක් වේ නම් එය ද ඵලදායී පොලී අනුපාතය යොදා ගනිමින් වත්කමේ ඉතිරි ජීව කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ. වත්කම පසුව හානිකරණය සඳහා තීරණය වේ නම්, එවිට හිමිකමේ වාර්තා කරන ලද මුදල ආදායම් ප්‍රකාශනයට යළි වර්ගීකරණය කෙරේ.

## හඳුනා නොගැනීම (Derecognition)

මූල්‍ය වත්කමක් (හෝ, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක් ලෙස අදාළ වන විට) හඳුනා නොගැනෙන්නේ,

(i) ඉකුත් වූ වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීම සඳහා හිමිකම් තිබෙන විට:

(ii) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීම සඳහා සමූහය එහි හිමිකම් මාරු කළ විට හෝ ප්‍රමාණාත්මක ප්‍රමාදයන් නොමැතිව 'pass-through' වැඩ පිළිවෙළක් යටතේ ලැබුණු මුදල් ප්‍රවාහ තුන්වන පාර්ශ්වයකට සම්පූර්ණයෙන් ගෙවීම සඳහා බැඳීමක් උපකල්පනය කළ විට සහ,

- සමූහය විසින් වත්කමේ සියළු අවදානම් සහ ප්‍රතිඵල මුළුමනින්ම මාරු කළ විට හෝ

- වත්කමේ සියළු අවදානම් සහ ප්‍රතිඵල (Rewards) සමූහය සම්පූර්ණයෙන් මාරු කළ නැතහොත් රඳවා ගත් එහෙත් වත්කමේ පාලනය මාරු කළ විට.

වත්කමකින් මූල්‍ය ප්‍රවාහ ලැබීම සඳහා සමූහය එහි හිමිකම් මාරු කළ විට හෝ 'pass-through' වැඩ පිළිවෙළකට ඇතුළත් වූ විට සහ වත්කමේ සියළු අවදානම් හා ප්‍රතිඵල මුළුමනින්ම මාරු නොකළ හෝ රඳවා නොගත්විට හෝ එහි පාලනය මාරු නොකළ විට, සමාගමේ අඛණ්ඩ මැදිහත්වීම පවත්වා ගැනීමට වත්කම යම් දුරකට හඳුනා ගනු ලැබේ.

එම අවස්ථාවේදී, සමූහය සම්බන්ධිත වගකීමක් ද හඳුනාගනී. මාරු කළ වත්කම් හා සම්බන්ධිත වගකීම, සමූහය රඳවාගත් හිමිකම් හා වගකීම් නිරූපනය වන පදනමකට මාරු කළ වත්කම් හා සම්බන්ධිත වගකීම මිනුම් කෙරේ.

මාරු කළ වත්කම් මත සහතිකයක් ආකාරයෙන් ගැනෙන අඛණ්ඩ මැදිහත්වීම වත්කමේ මුල් ධාරණ අගයට අඩු අගයට හා සමූහයට යළි ගෙවීමට අවශ්‍ය වන සැලකිල්ලට ගත් උපරිම මුදලට මිනුම් කෙරේ.

## (II) මූල්‍ය වත්කම් හානිකරණය

එක් එක් වාර්තාකරණ දිනයට සමූහය විසින් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය කෙරේ ද යන යම් විෂය නිශ්‍රිත සාක්ෂියක් වේද යන්න තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය සඳහා සැලකිල්ලට ගැනෙන්නේ, වත්කමේ ආරම්භක හඳුනා ගැනීමෙන් පසු සිදුවන එකක් හෝ වැඩි ගණනක් සිද්ධිවල ප්‍රතිඵලයක් ලෙස හානිකරණය පිළිබඳ විෂය නිශ්‍රිත සාක්ෂියක් වේ නම් පමණක් හා විශ්වාසදායීව ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහයන් මත බලපෑමක් එම හානි සිද්ධියෙහි තිබේ නම් පමණි.

ණයගැතියන් හෝ ණයගැතියන් සමූහයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවලට මුහුණදීම, පොලී හෝ ප්‍රාග්ධන ගෙවීම් පැහැර හැරීම් හෝ යුතුකම් පැහැර හැරීම් අත්දැකීම, ඔවුන් බුන්වත් බවට පත්වීමේ හැකියාව හෝ වෙනත් මූල්‍ය අසංවිධානයන් සහ ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි ගණනය කළ හැකි අඩුවීමක් පවතින බවට නිරීක්ෂණගත දත්ත දක්වන විට, එනම් හිඟයන්හි හෝ පැහැර හැරීම් සහසම්බන්ධිත ආර්ථික කරුණුවල වෙනස්වීම් ඇති විට යන සංඥාවන් හානිකරණය පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් වේ.

### ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කෙරෙන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කෙරෙන මූල්‍ය වත්කම් සඳහා, තනිතනිව වැදගත්වන මූල්‍ය වත්කම් සඳහා හෝ තනිතනිව වැදගත් නොවන එකතුවක් වන මූල්‍ය වත්කම් සඳහා හානිකරණය පිළිබඳ විෂය නිශ්‍රිත සාක්ෂි තනිතනිව පවතින්නේ ද යන්න සමූහය විසින් මුලදී තක්සේරු කරයි. තනිතනිව තක්සේරු කළ මූල්‍ය වත්කමක් සඳහා හානිකරණය පිළිබඳ විෂය නිශ්‍රිත සාක්ෂියක් නොවන බවට සමූහය තීරණය කරන්නේ නම්, එය වැදගත් හෝ නොවුවද සමාන ණය අවදානම් ලක්ෂණයන් සහිත මූල්‍ය වත්කම් සමූහයක වත්කම් එයට ඇතුළත් වන අතර හානිකරණය සඳහා සාමූහිකව ඒවා තක්සේරු කරයි. හානිකරණය සඳහා තනිතනිව තක්සේරු කරන වත්කම් සහ හානිකරණ පාඩුවක් සඳහා හෝ පවත්වා ගත යුතු හඳුනාගත් වත්කම් හානිකරණයේ සාමූහික තක්සේරුවේදී ඇතුළත් නොවේ.

හානිකරණ පාඩුවක් දරන ලද බවට විෂය නිශ්‍රිත සාක්ෂි තිබේ නම් පාඩුවේ ප්‍රමාණය, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් (තවමත් නොදරන ලද අනාගත අපේක්ෂිත බැර පාඩු හැර) පිළිබඳ වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මිනිනු ලැබේ. අනාගත ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. ණය මුදලක විචල්‍ය පොලී අනුපාතයක් තිබේ නම් ඕනෑම හානිකරණ පාඩුවක් මැනීම සඳහා වට්ටම් අනුපාතය වන්නේ වර්තමාන ඵලදායී පොලී අනුපාතයයි.

ඉඩ දෙන ගිණුමක් භාවිතය මඟින් වත්කම පිළිබඳ ධාරණ අගය අඩු කරනු ලබන අතර පාඩුවේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. පොලී ආදායම උපචිතවීම සඳහා ධාරණ මුදලේ අඩුකිරීම මත පවත්වා ගන්නා අතර හානිකරණ පාඩුව මිනීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම සඳහා යොදාගත් පොලී අනුපාතය යොදා ගනිමින් උපචිත කරනු ලැබේ. පොලී ආදායම ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. අනාගත අයකිරීම පිළිබඳ තාත්වික අපේක්ෂාවක් නොවන විට හා සියළු ඇප උපලබ්ධි වූ හෝ සමූහයට මාරු කළ විට සම්බන්ධිත ඉඩදීම සමඟ ණය කපා හරිනු ලැබේ. පසු වර්ෂයකදී නම්, හානිකරණය හඳුනා ගැනීමෙන් පසු සිදුවූ සිද්ධියක් නිසා ඇස්තමේන්තුගත හානිකරණ පාඩුවේ ප්‍රමාණය වැඩිවීම් හෝ අඩුවීම් වන අතර පෙර හඳුනාගත් හානිකරණ පාඩුව ඉඩදීම් ගිණුම ගැලපීම් කිරීම මඟින් වැඩි කිරීම හෝ අඩු කිරීම සිදුවේ. අනාගත කපා හැරීමක් පසුව අයකර ගැනේ නම්, අයකර ගැනීම ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැයට බැර කරනු ලැබේ.

**විකිණීමට ඇති මූල්‍ය ආයෝජනයන්**

ආයෝජනයක් හෝ ආයෝජන සමූහයක් හානිකරණය වූ බවට විෂය නිශ්‍රිත සාක්ෂි තිබේ ද යන්න විකිණීමට ඇති මූල්‍ය ආයෝජනයන් සඳහා සමූහය එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරයි.

විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කරන ලද ස්කන්ධ ආයෝජනයන්හිදී ආයෝජනයේ සාධාරණ අගයේ එහි පිරිවැයට අඩු සැලකිය යුතු හා දිගට පවත්නා අඩුවීමක් විෂය නිශ්‍රිත සාක්ෂිවල ඇතුළත් වේ. හානිකරණය පිළිබඳ සාක්ෂි තිබේ නම් ආදායම් ප්‍රකාශනයේ පෙර හඳුනාගත් ආයෝජනය මත යම් හානිකරණ පාඩුවක් අඩුකර අත්කරගත් පිරිවැය හා වර්තමාන සාධාරණ අගය අතර වෙනස ලෙස මැනෙන සමුච්චිත පාඩුව වෙනත් විස්තීර්ණ ආදායමෙන් ඉවත් කර ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ. ස්කන්ධ ආයෝජනයන් මත හානිකරණ පාඩු ආදායම් ප්‍රකාශනය මගින් ප්‍රතිවර්තනය නොකෙරේ. හානිකරණයෙන් පසු ඒවායේ සාධාරණ අගය වැඩිවීම් වෙනත් විස්තීර්ණ ආදායමේ සෘජුවම හඳුනාගනු ලැබේ.

විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කරන ලද ණය උපකරණවලදී ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කෙරෙන මූල්‍ය වත්කම් ලෙස සමාන නිර්ණායකය මත පදනම්ව හානිකරණය තක්සේරු කරනු ලැබේ. කෙසේ වුවද ආදායම් ප්‍රකාශනයේ පෙර හඳුනාගත් ආයෝජනය මත යම් හානිකරණ පාඩුවක් අඩුකර ක්‍රමක්ෂය පිරිවැය හා වර්තමාන සාධාරණ අගය අතර වෙනස ලෙස මනින ලද හානිකරණය සඳහා වාර්තා කරන ලද මුදල සමුච්චිත පාඩුවයි.

හානිකරණ පාඩුව මිණීමේ කාර්යය සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහයන් වට්ටම් කිරීම සඳහා යොදාගත් පොලී අනුපාතය යොදා ගනිමින් වත්කමේ අඩු කරන ලද ධාරණ අගය මත පදනම් වූ අනාගත පොලී ආදායම උපචිතවීම සඳහා නොකඩවා පවත්වාගෙන යයි. පොලී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. පසු වර්ෂයකදී ණය උපකරණයක සාධාරණ අගය වැඩිවන්නේ නම් සහ වැඩිවීම ආදායම් ප්‍රකාශනයේ හානිකරණ පාඩුව හඳුනා ගැනීමෙන් පසු සිදුවන සිදුවීමකට විෂය නිශ්‍රිතව සම්බන්ධ කළ හැකි නම් හානිකරණ පාඩුව ආදායම් ප්‍රකාශනය මගින් ප්‍රතිවර්තනය කෙරේ.

### (III) මූල්‍ය වගකීම්

**ආරම්භක හඳුනා ගැනීම හා මිනුම්කරණය**

මූල්‍ය වගකීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 හි විෂය පථය තුළ ලාභය හෝ පාඩුව, ණය සහ ණය ගැනීම්, වෙනත් මූල්‍ය වගකීම් මගින් හෝ ඵලදායී ඇවුරුමකදී ඇවුරුම් උපකරණයක් ලෙස හඳුන්වන ව්‍යුත්පන්නයන් ලෙස අදාළ පරිදි සාධාරණ අගයට මූල්‍ය වගකීම් ලෙස විශ්ලේෂණය කෙරේ. සමූහය විසින් එහි මූල්‍ය වගකීම් පිළිබඳ විශ්ලේෂණය ආරම්භක හඳුනා ගැනීමේදී තීරණය කරයි.

සියළු මූල්‍ය වගකීම් ආරම්භකව සාධාරණ අගයට සහ ණය සහ ණය ගැනීම්වලදී සහ වෙනත් මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කෙරේ. මෙය සෘජුවම ආරෝපිත ගනුදෙනු පිරිවැයෙහි ඇතුළත් කෙරේ.

සමූහයේ මූල්‍ය වගකීම්වල වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ, බැංකු අයිරා, ණය සහ ණය ගැනීම් වෙනත් මූල්‍ය වගකීම් ඇතුළත් වේ.

**පසු මිනුම්කරණය**

මූල්‍ය වගකීම් පිළිබඳ මිනුම්කරණය පහත පරිදි ඒවායේ විශ්ලේෂණය මත රඳා පවතී.

**ණය සහ ණය ගැනීම්**

ආරම්භක හඳුනා ගැනීමෙන් පසු, පොලී සහිත ණය සහ ණය ගැනීම් ඵලදායී පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුව මනිනු ලැබේ. වගකීම් නොහඳුනාගත් විට ලාභ හා පාඩු ද ඵලදායී පොලී අනුපාත ක්‍රමය (EIR) මගින් ක්‍රමක්ෂය ක්‍රියාවලිය ද ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනේ.

අත්කර ගැනීමේදී යම් වට්ටමක් හෝ වාරිකයක් සහ ඵලදායී පොලී අනුපාතයේ (EIR) කොටසක් වන ගාස්තු හෝ පිරිවැය ගිණුම්ගත කිරීම මගින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායී පොලී අනුපාතයේ (EIR) ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැයෙහි ඇතුළත් කරනු ලැබේ.

**හඳුනා නොගැනීම**

මූල්‍ය වගකීම හඳුනා නොගැනීම වන්නේ වගකීම යටතේ බැඳීම නිදහස් කරන හෝ අවලංගු කරන හෝ ඉකුත් වන අවස්ථාවේදීය.

පවත්නා මූල්‍ය වගකීම ණය දෙන්නා වෙනුවට වෙනත් කෙනෙකු සැලකිය යුතු වෙනස් කරුණු මත හෝ පවත්නා වගකීමේ කොන්දේසි සැලකිය යුතු ලෙස නවීකරණය වීම මත ආදේශ කිරීමේදී, එවැනි හුවමාරුවක් හෝ නවීකරණයක් ආරම්භක වගකීමේ හඳුනා නොගැනීමක් ලෙස සලකනු ලබයි. නව වගකීමේ හඳුනා ගැනීම සහ අදාළ ධාරණ අගයන්හි වෙනස ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

### (IV) මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කරන ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන්නේ හඳුනාගත් ප්‍රමාණයන් හිලව් කිරීම සඳහා බලපැවැත්වෙන වර්තමාන නෛතික හිමිකමක් ඇත්තේ නම් පමණක් හා ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීම සඳහා අපේක්ෂාවක් ඇත්තේ නම් හෝ වත්කම් උපලබ්ධිවීම සඳහා හා වගකීම් සමානව නිරවුල් කිරීම සඳහා වේ.

### (V) මූල්‍ය උපකරණ පිළිබඳ සාධාරණ අගය

ක්‍රියාකාරී වෙළෙඳපොළවල එක් එක් වාර්තාකරණ දිනයට වෙළෙඳාම් වන මූල්‍ය උපකරණවල සාධාරණ අගය, ප්‍රකාශිත වෙළෙඳපොළ මිල සඳහා හෝ ගනුදෙනුකරුවන්ගේ මිල ප්‍රකාශිතයන්ට යොමු කිරීම මගින් (දිගු තත්ත්වයක් සඳහා ලංසු මිල හා කෙටි තත්ත්වයක් සඳහා ඉල්ලුම් මිල) ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩුකිරීමක් නොමැතිව තීරණය කරනු ලැබේ.

ක්‍රියාකාරී වෙළෙඳපොළක වෙළෙඳාම් නොවන මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය අදාළ තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රම යොදා ගනිමින් තීරණය කරනු ලැබේ. ඉතා මෑත වෙළෙඳපොළ ගනුදෙනු භාවිත කරමින් එම ශිල්පීය ක්‍රමවල බොහෝ දුරට එකම වූ වෙනත් උපකරණයක වර්තමාන සාධාරණ අගයට යොමු කර: වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ විශ්ලේෂණයක් හෝ වෙනත් තක්සේරු ආදර්ශයක් ඇතුළත් විය හැක.

### 2.2.10 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සමූහය විසින් එක් එක් වාර්තාකරණ දිනයට, වත්කමක් හානිකරණය වීමට ඇඟවීමක් තිබේද යන්න තක්සේරු කරනු ලැබේ. යම් කිසි ඇඟවීමක් පවතී නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වේ නම්, සමූහය විසින් වත්කමේ අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි (CGU) විකිණීම සඳහා පිරිවැය අඩු සාධාරණ අගය හා එහි භාවිත වටිනාකම හා තනි වත්කමක් සඳහා තීරණය කෙරෙන වත්කමක අයකරගත හැකි මුදල වන අතර එසේ නැත්නම් වෙනත් වත්කම් හෝ වත්කම් සමූහයකින් විශාල ලෙස ස්වාධීන වන මුදල් ගලා ඒම වත්කම උත්පාදනය නොකෙරේ. වත්කමක ධාරණ අගය හෝ මුදල් උත්පාදන ඒකකය (CGU) එහි අයකර ගත හැකි වටිනාකම ඉක්මවන විට වත්කම හානිකරණය සඳහා සලකන අතර එහි අයකර ගත හැකි මුදලට ලියා හරිනු ලැබේ. තක්සේරු වටිනාකම භාවිතයේදී ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වර්තමාන වෙළෙඳපොළ තක්සේරු මුදලේ කාලීන වටිනාකම සහ වත්කමට විශේෂිත අවදානම් නිරූපනය වන පූර්ව–බදු වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ. විකිණීම සඳහා පිරිවැය අඩු සාධාරණ අගය තීරණය කිරීමේදී මෑත වෙළෙඳපොළ ගනුදෙනු තිබේ නම් සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනු හඳුනා ගැනීමට නොහැක්කේ නම්, අදාළ තක්සේරු ආදර්ශයක් (Model) යොදා ගනු ලැබේ. විවිධ තක්සේරු පොදු වෙළෙඳ පරිපාලිතයන් සඳහා මිල ප්‍රකාශිත කොටස් මිල හෝ වෙනත් ලබාගත හැකි සාධාරණ අගය දර්ශකයන් මඟින් මෙම ගණනය කිරීම් තහවුරු කරනු ලැබේ.

ඉන්වෙන්ට්‍රි මත හානිකරණය ඇතුළත් අඛණ්ඩ මෙහෙයුම් පිළිබඳ හානිකරණ පාඩු, පෙර ප්‍රත්‍යාගණිත දේපලක් සඳහා හැර, වෙනත් විස්තීර්ණ ආදායමට ප්‍රත්‍යාගණනය ගැනීමේදී හානිකරණ වත්කම පිළිබඳ කාර්යයට අනුරූප එම වියදම් වර්ගයන්හි ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. මෙහිදී පෙර යම් ප්‍රත්‍යාගණන මුදලක් දක්වා වෙනත් විස්තීර්ණ ආදායමේ ද හානිකරණය හඳුනාගනු ලැබේ.

කීර්තිනාමය හැර අනිකුත් වත්කම් සඳහා පෙර හඳුනාගත් හානිකරණ පාඩු තවදුරටත් නොපවතින්නේ ද හෝ අඩුවේ ද යන්න පිළිබඳ යම් ඇඟවීමක් තිබේ ද යන්න සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරුවක් සිදු කරනු ලැබේ. එවැනි ඇඟවීමක් පවතී නම්, සමූහය විසින් වත්කමේ හෝ මුදල් උත්පාදන ඒකකයේ අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කරයි. පෙර හානිකරණ පාඩුව හඳුනා ගැනීමේ සිට වත්කමේ අයකර ගත හැකි මුදල තීරණය කිරීම සඳහා යොදා ගන්නා උපකල්පනයන්හි වෙනසක් තිබේ නම් පමණක් පෙර හඳුනාගන්නා ලද හානිකරණ පාඩුව ප්‍රතිවර්තනය කරනු ලැබේ. ක්ෂය අඩු කළ පසු වත්කමේ ධාරණ අගය අයකර ගත හැකි මුදල නොඉක්මවන්නේ නම් හෝ තීරණය කළ යුතු වූ ධාරණ අගය නොඉක්මවන්නේ නම්, පෙර වර්ෂයේ වත්කම් සඳහා හානිකරණ පාඩු හඳුනා නොගන්නා බැවින් ප්‍රතිවර්තනය සීමාවනු ලැබේ. ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකන ලද ප්‍රතිවර්තනයකදී, වත්කම ප්‍රත්‍යාගණිත මුදලට ධාරණය නොවේ නම් එවැනි ප්‍රතිවර්තනය ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

### 2.2.11 මුදල් හා කෙටිකාලීන තැන්පතු

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා කෙටිකාලීන තැන්පතු, බැංකුවේ ඇති මුදල් හා අතේ ඇති මුදල් සහ මාස තුනකට හෝ ඊට අඩු පරිණතවීම් කාලයක් සහිත කෙටිකාලීන තැන්පතුවලින් සමන්විත වේ. සමූහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා මුදල් හා මුදල් සමාන ශේෂ ඉහත නිර්වචනය කරන ලද පරිදි හිඟ බැංකු අයිරා අඩු කිරීමෙන් පසු මුදල් හා කෙටිකාලීන තැන්පතුවලින් සමන්විත වේ.

### 2.2.12 ප්‍රතිපාදන

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමාන වගකීමක් (නෛතික හෝ නිර්මාණිත) ඇති වන විට ප්‍රතිපාදන හඳුනා ගැනේ. වගකීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් ගලායාමක් විය හැකි අතර වගකීමේ ප්‍රමාණයට විශ්වසනීය ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වේ. ප්‍රතිපාදනයේ සමහරක් හෝ සියල්ල ප්‍රතිපූර්ණය කිරීම සඳහා සමූහය අපේක්ෂා කෙරේ නම් උදාහරණයක් වශයෙන් රක්ෂණ කොන්ත්‍රාත්තුවක් යටතේ ප්‍රතිපූර්ණය වෙනම වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර එහෙත් ප්‍රතිපූර්ණය සැබැවින්ම නිශ්චිත වූ විට පමණක් වේ. ඕනෑම ප්‍රතිපාදනයකට අදාළ වියදම යම් ප්‍රතිපූර්ණයක් අඩු කර ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මුදලේ කාලීන වටිනාකම පිළිබඳ බලපෑම ප්‍රමාණාත්මක නම්, වගකීමේ විශේෂිත අවදානම් නිරූපනය වන ප්‍රවර්ථන බදු–පූර්ව අනුපාතය යොදා ගනිමින් අදාළ පරිදි ප්‍රතිපාදනයන් වට්ටම් කරනු ලැබේ. වට්ටම් කිරීම යොදා ගැනීමේදී, කාල සංක්‍රමණය හේතුවෙන් ප්‍රතිපාදනයේ වැඩිවීම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනාගනු ලැබේ.

### 2.2.13 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### (අ) නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසිවලට අනුකූල වන පරිදි සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ දායකයට හා සේවක භාරකාර අරමුදල් දායකයට සුදුසු වේ. සමාගම විසින් සේවකයන්ගේ දළ වැටුපෙන් 15% ක් හා 3% ක් පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක වේ.

### (ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

සමාගම විසින් ආයු ගණක තක්සේරු උපදෙස් සමග ප්‍රක්ෂිප්ත ප්‍රතිලාභ තක්සේරු ක්‍රමය යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් වූ පාරිතෝෂික පිළිබඳ ගිවිසුම්ගත විශ්‍රාම ප්‍රතිලාභ වර්තමාන වටිනාකම මනිනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ආයු ගණක ලාභ හා පාඩු එය පැන නැගි මූල්‍ය වර්ෂය තුළ ආදායම හෝ වියදම ලෙස වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ.

කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව, වර්ෂ 5ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කිරීමෙන් පසු පමණක් මෙම වගකීම පැන නගී.

පාරිතෝෂික වගකීම සඳහා බාහිරව මූල්‍යයනය කරනු නොලැබේ.

### 2.3 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන්

සමූහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ආදායම, වියදම්, වත්කම් හා වගකීම් සහ අසම්භාව්‍ය බැරකම් පිළිබඳ හෙළිදරව් කිරීම් පිළිබඳ වාර්තාගත ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේදී කළමනාකරණය විසින් සිදුකිරීම අවශ්‍ය වේ. කෙසේ වුවද මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවයන්, අනාගත කාල පරිච්ඡේදවලදී බලපාන වත්කම් හෝ වගකීමේ ධාරණ අගය සඳහා අවශ්‍යවන ප්‍රමාණාත්මක ගැලපීමක් වන ප්‍රතිඵල කෙරෙහි හේතු වේ.

### විනිශ්චයන්

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේදී මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන් මත වඩාත් වැදගත් බලපෑමක් ඇතිවන පහත සඳහන් විනිශ්චයන් කළමනාකරණය විසින් සිදුකර ඇත.

### විලම්බිත බදු වත්කම්

භාවිත නොකළ සියළු බදු පාඩු සඳහා විලම්බිත බදු වත්කම් යම්දුරකට හඳුනාගනු ලබන අතර පාඩුවලට එරෙහිව උපයෝජනය කළ හැකි බදු අයකළ යුතු ලාභය, අපේක්ෂා කළ හැකි වේ. අනාගත බදු සැලසුම් උපාය මාර්ග සහිතව විය හැකි කාලය හා අනාගත බදු අය කළ යුතු ලාභවල මට්ටම පදනම් කරගෙන හඳුනාගත හැකි වන විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණයන් තීරණය කිරීම සඳහා වැදගත් කළමනාකරණ විනිශ්චයන් අවශ්‍ය වේ.

### ඇස්තමේන්තු හා උපකල්පනයන්

ඊළඟ මුදල් වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම්වල ධාරණ අගය සඳහා ප්‍රමාණාත්මක ගැලපීමක් කිරීමට හේතුවන සැලකිය යුතු අවදානමක් ඇති අනාගතය සම්බන්ධයෙන් වන ප්‍රධාන උපකල්පනයන් හා වාර්තාකරණ දිනයට අවිනිශ්චිත ඇස්තමේන්තු පිළිබඳ වෙනත් ප්‍රධාන ප්‍රභවයන් පහත විස්තර කෙරේ. සමූහය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ලබාගත හැකි වූ පරාමිතින් මත එහි උපකල්පනයන් හා ඇස්තමේන්තු පදනම් කරන ලදී. කෙසේ වුවද අනාගත සංවර්ධනයන් පිළිබඳ පවත්නා තත්ත්වයන් හා උපකල්පනයන්, වෙළෙඳපොළ වෙනස්වීම් හෝ සමූහයේ පාලනයෙන් බැහැරව පැන නගින තත්ත්වයන් හේතුවෙන් වෙනස් වේ. එවැනි වෙනස්වීම් ඒවා සිදුවන අවස්ථාවේදී උපකල්පනයන්හි නිරූපනය වේ.

### නිශ්චිත ප්‍රතිලාභ සැලස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂික පිළිබඳ පිරිවැය, ආයු ගණක තක්සේරුවක් යොදා ගනිමින් තීරණය කරනු ලැබේ. වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් හා විශ්‍රාම යාමේ වයස පිළිබඳ උපකල්පනයන් සිදු කිරීම ආයු ගණක තක්සේරුවට ඇතුළත් වේ. මෙම සැලසුම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. සියළු උපකල්පනයන් එක් එක් වාර්තාකරණ දිනයට සමාලෝචනය කරනු ලැබේ.

## 2.4 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් හා හෙළිදරව් කිරීම

### ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 - සේවක ප්‍රතිලාභ (2013 සංශෝධිත)

සමූහය විසින් සංශෝධිත ප්‍රමිතිවල දක්වන ලද තාවකාලික විධිවිධානවලට අනුකූලව ප්‍රවර්තන කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 (සංශෝධිත 19) අදාළ කරන ලදී. සමූහයට බලපාන ප්‍රධාන වෙනස්කම් සඳහා පහත සඳහන් කරුණු ඇතුළත් වේ.

ආයු ගණක වාසි හා පාඩු ආදායම් ප්‍රකාශනයේ ඒවා සිදුවූ කාල පරිච්ඡේදයේදී සමූහය විසින් පෙර හඳුනාගන්නා ලදී. මෙම ක්‍රමය සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 යටතේ තවදුරටත් අනුමත නොකරන අතර වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ නිරූපනය වන ආයු ගණක වාසිය හා පාඩු සිදුවූ කාලපරිච්ඡේදයේදී හඳුනාගැනීම සඳහා සමූහය විසින් එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කරන ලදී.

බලපෑම ප්‍රමාණාත්මක නොවීම හේතුවෙන් මෙම අදාළ කර ගැනීමේ බලපෑම ප්‍රත්‍යක්ෂණව ගිණුම්ගත කරනු නොලැබේ.

## 2.5 නිකුත් කළ එහෙත් මෙතෙක් බලනොපාන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල බලපෑම

පහත දැක්වෙන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අතර ඒවා අනාගතයේ බලපැවැත්වෙන දිනයක් ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඒවා අදාළ කර නොගන්නා ලදී. සමූහය විසින් වර්තමානයේ යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මත එම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, බලපෑමක් ඇති වන අතර අනාගත මූල්‍ය ප්‍රකාශන මත ද බලපෑමක් ඇති විය හැක.

### (අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 - මූල්‍ය උපකරණ: වර්ගීකරණය හා මිනුම්කරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 වෙනුවට මෙම කාර්යයෙහි පළමු අදියර නිරූපණය ලෙස නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය හා මිනුම්කරණය සඳහා අදාළ වේ. සමූහය විසින් යථා කාලයේදී බලපෑම ප්‍රමාණනය කරනු ඇත.

මෙම ප්‍රමිතිය 2015 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදයන් සඳහා ආරම්භකව බලපාන ලදී. කෙසේ වුවද පසුව බලපෑම් දිනය කල් දමන ලදී.

### (ආ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13 - සාධාරණ අගය මිනුම්කරණය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යටතේ සියළු සාධාරණ අගය මිනුම්කරණයන් සඳහා මගපෙන්වීම පිළිබඳ තනි ප්‍රභවයක් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13 මගින් ස්ථාපිත කර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යටතේ සියළු සාධාරණ අගය මිනුම්කරණය පිළිබඳ මග පෙන්වීම් සපයයි.

මෙම ප්‍රමිතිය 2014 ජනවාරි 01 දින හෝ ඉන්පසු ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදය සඳහා බලපැවැත් වේ. කෙසේ වුවද මෙම ප්‍රමිතියේ අඩංගු සාධාරණ අගය මිනුම්කරණ මූලධර්ම යොදා ගැනීම වර්තමානයේ නිර්දේශ කෙරේ.

ඉහත කරුණුවලට අමතරව, 2014 ජනවාරි 01 දින හෝ ඉන්පසු ආරම්භවන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා පහත සඳහන් ප්‍රමිතීන් ද බලපැවැත්වේ.

### ශ්‍රී ලංමුවාප්‍ර 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන
### ශ්‍රී ලංමුවාප්‍ර 11 - ඒකාබද්ධ සැලසුම්
### ශ්‍රී ලංමුවාප්‍ර 12 - වෙනත් ආයතනවල බැඳීම් පිළිබඳ හෙළිදරව් කිරීම්

දැනට ශ්‍රී ලං.ගි.ප්‍ර 27 – ඒකාබද්ධ හා වෙනම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලං.ගි.ප්‍ර 28 ආශ්‍රිතයන්හි ආයෝජන යන ප්‍රමිතීන්හි අඩංගු හඳුනා ගැනීම, මිනුම්කරණය හා හෙළිදරව් කිරීම කෙරෙහි ඉහත ප්‍රමිතීන් 3 බලපානු ඇත. ශ්‍රී ලංගිප්‍ර 31 – බද්ධ ව්‍යාපාරවල අයිතීන් සහ SIC 12 සහ SIC 13 පිළිවෙළින් විශේෂිත කාර්ය ආයතනවල (SPES) සහ ඒකාබද්ධව පාලනය වන ආයතනවල ඒකාබද්ධ කිරීම මත බලපෑමක් ඇති වන ප්‍රමිතීන් වේ.

විශේෂිත ව්‍යාපාර ආයතන (SPES) ඇතුළත් සියළු ආයතන සඳහා අදාළ වන තනි පාලන ආදර්ශයක් ස්ථාපනය කිරීම සහ හවුල්ව පාලනය වන ආයතන පිළිබඳ සමානුපාතික ඒකාබද්ධ කිරීම ඉවත් කිරීම, පිළිවෙළින් ශ්‍රී ලං.මු.වා.ප්‍ර 10 සහ ශ්‍රී ලං.මු.වා.ප්‍ර 11 යටතේ හඳුන්වා දෙන ලද වැදගත් වෙනස්කම් වේ.

වෙනත් ව්‍යාපාරවල අයිතීන්වලට අදාළ වන හෙළිදරව් කිරීම් මත ප්‍රමිතියක් ශ්‍රී ලං.මු,වා.ප්‍ර 12 මඟින් ස්ථාපිත කෙරේ. ශ්‍රී ලං.මු.වා.ප්‍ර 27, ශ්‍රී ලං.මු.වා.ප්‍ර 28 හා ශ්‍රී ලං.මු.වා.ප්‍ර 31 යන කලින් හඳුනාගන්නා ලද ප්‍රමිතීන්වල මෙන්ම මෙහිදී ද නව හෙළිදරව් කිරීම් අන්තර්ගත වේ.

මෙම ප්‍රමිතීන් ඒවා බලපැවැත්වූ විට සමූහය විසින් අදාළ කරනු ලැබේ. විස්තරාත්මක සමාලෝචනය නිමවන තෙක්, මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීමේ දිනයට මූල්‍ය බලපෑම සාධාරණව නිමානය කළ නොහැක.

**3. දේපල, පිරියත හා උපකරණ සමූහය**

| | | 2013.01.01 දිනට ශේෂය රු.'000 | එකතු කිරීම් රු.'000 | අපහරණයන්/ මාරු කිරීම් රු.'000 | 2013.12.31 දිනට ශේෂය රු.'000 |
|---|---|---|---|---|---|
| **3.1** | **දළ ධාරණ අගයන්** | | | | |
| **3.1.1** | **පිරිවැයට** | | | | |
| | කල් බදු ඉඩම් සඳහා වැඩිදියුණු කිරීම් | 2,883 | - | - | 2,883 |
| | ගොඩනැගිලි | 15,816 | - | - | 15,816 |
| | මෝටර් වාහන | 607,443 | 55,590 | (27,557) | 635,476 |
| | පරිගණක | 259,896 | 18,617 | - | 278,513 |
| | කාර්යාල උපකරණ | 302,328 | 41,454 | (6,419) | 337,363 |
| | පිරියත හා යන්ත්‍රෝපකරණ | 89,660 | - | - | 89,660 |
| | යටිතල සැපයීම් | 19,006,698 | 605,182 | (64,997) | 19,546,883 |
| | | **20,284,724** | **720,843** | **(98,973)** | **20,906,594** |
| | **තක්සේරුවට** | | | | |
| | සින්නක්කර ඉඩම | 1,290,021 | 86,459 | - | 1,376,480 |
| | ගොඩනැගිලි | 567,257 | 9,845 | - | 577,102 |
| | | **1,857,278** | **96,304** | **-** | **1,953,582** |
| | **ක්ෂය කළ යුතු වත්කම් මුළු වටිනාකම** | **22,142,002** | **817,147** | **(98,973)** | **22,860,176** |

| | | 2013.01.01 දිනට ශේෂය රු.'000 | එකතු කිරීම් රු.'000 | මාරු කිරීම් රු.'000 | 2013.12.31 දිනට ශේෂය රු.'000 |
|---|---|---|---|---|---|
| **3.1.2** | **ඉදිකිරීම්වලදී** | | | | |
| | යටිතල සැපයීම | 489,848 | 595,346 | (679,768) | 405,426 |
| | | **489,848** | **595,346** | **(679,768)** | **405,426** |
| | **මුළු දළ ධාරණ අගය** | **22,631,850** | **1,412,493** | **(778,741)** | **23,265,602** |

| | | 2013.01.01 දිනට ශේෂය රු.'000 | වර්ෂය සඳහා අයකිරීම් රු.'000 | අපහරණයන්/ මාරු කිරීම් රු.'000 | 2013.12.31 දිනට ශේෂය රු.'000 |
|---|---|---|---|---|---|
| **3.1.3** | **ක්ෂය** | | | | |
| | **පිරිවැයට** | | | | |
| | කල් බදු ඉඩම් සඳහා වැඩිදියුණු කිරීම් | 662 | 70 | - | 732 |
| | ගොඩනැගිලි | - | 280 | - | 280 |
| | මෝටර් වාහන | 342,026 | 69,328 | (26,879) | 384,475 |
| | පරිගණක | 225,959 | 12,038 | - | 237,997 |
| | කාර්යාල උපකරණ | 238,290 | 16,254 | (5,823) | 248,721 |
| | පිරියත හා යන්ත්‍රෝපකරණ | 44,521 | 10,729 | - | 55,250 |
| | යටිතල සැපයීම | **11,268,957** | **725,320** | **(28,907)** | **11,965,370** |
| | | **12,120,415** | **834,019** | **(61,609)** | **12,892,825** |
| | **තක්සේරුවට** | | | | |
| | ගොඩනැගිලි | 14,180 | 14,238 | - | 28,418 |
| | | **14,180** | **14,238** | **-** | **28,418** |
| | **මුළු ක්ෂය** | **12,134,595** | **848,257** | **(61,609)** | **12,921,243** |

**3. දේපල, පිරියත හා උපකරණ (සම්බන්ධිතයි)**
**සමූහය**

| **3.1.4 ශුද්ධ පොත් අගය** | **2013 රු.'000** | **2012 රු.'000** |
|---|---|---|
| **පිරිවැයට** | | |
| කල් බදු ඉඩම් සඳහා වැඩිදියුණු කිරීම් | 2,151 | 2,221 |
| ගොඩනැගිලි | 15,536 | 15,816 |
| මෝටර් වාහන | 251,001 | 265,417 |
| පරිගණක | 40,516 | 33,937 |
| කාර්යාල උපකරණ | 88,642 | 64,038 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 34,410 | 45,139 |
| යටිතල සැපයීම | 7,581,513 | 7,737,741 |
| | **8,013,769** | **8,164,309** |
| **තක්සේරුවට** | | |
| සින්නක්කර ඉඩම් | 1,376,480 | 1,290,021 |
| ගොඩනැගිලි | 548,684 | 553,077 |
| | **1,925,164** | **1,843,098** |
| **කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ** | | |
| යටිතල සැපයීම | 405,426 | 489,848 |
| | **405,426** | **489,848** |
| **දේපල, පිරියත හා උපකරණවල මුළු ශුද්ධ ධාරණ අගය** | **10,344,359** | **10,497,255** |

**3. දේපල, පිරියත හා උපකරණ**
**සමාගම**

| **3.2 දළ ධාරණ අගයන්** <br> **3.2.1 පිරිවැයට** | **2013.01.01 දිනට ශේෂය රු.'000** | **එකතු කිරීම් රු.'000** | **අපහරණයන්/ මාරු කිරීම් රු.'000** | **2013.12.31 දිනට ශේෂය රු.'000** |
|---|---|---|---|---|
| කල් බදු ඉඩම් සඳහා වැඩිදියුණු කිරීම් | 2,883 | - | - | 2,883 |
| ගොඩනැගිලි | 15,816 | - | - | 15,816 |
| මෝටර් වාහන | 602,835 | 55,590 | (27,557) | 630,868 |
| පරිගණක | 258,797 | 18,514 | - | 277,311 |
| කාර්යාල උපකරණ | 299,398 | 41,406 | (5,671) | 335,133 |
| යටිතල සැපයීම | 19,006,698 | 605,182 | (64,997) | 19,546,883 |
| | **20,186,427** | **720,692** | **(98,225)** | **20,808,894** |
| **තක්සේරුවට** | | | | |
| සින්නක්කර ඉඩම් | 1,290,021 | 86,459 | - | 1,376,480 |
| ගොඩනැගිලි | 567,257 | 9,845 | - | 577,102 |
| | **1,857,278** | **96,304** | **-** | **1,953,582** |
| **ක්ෂය කළ යුතු වත්කම්වල මුළු වටිනාකම** | **22,043,705** | **816,996** | **(98,225)** | **22,762,476** |

**3. දේපල, පිරියත හා උපකරණ (සම්බන්ධිතයි) සමාගම**

| 3.2.2 ඉදිකිරීම්වලදී | 2013.01.01 දිනට ශේෂය රු.'000 | එකතු කිරීම් රු.'000 | මාරු කිරීම් රු.'000 | 2013.12.31 දිනට ශේෂය රු.'000 |
|---|---|---|---|---|
| යටිතල සැපයීම | 492,299 | 595,346 | (679,768) | 407,877 |
| | **492,299** | **595,346** | **(679,768)** | **407,877** |
| **මුළු දළ ධාරණ අගය** | **22,536,004** | **1,412,342** | **(777,993)** | **23,170,353** |

| 3.2.3 ක්ෂය | 2013.01.01 දිනට ශේෂය රු.'000 | වර්ෂය සඳහා අයකිරීම් රු.'000 | අපහරණයන්/ මාරු කිරීම් රු.'000 | 2013.12.31 දිනට ශේෂය රු.'000 |
|---|---|---|---|---|
| **පිරිවැයට** | | | | |
| කල්බදු ඉඩම් සඳහා වැඩිදියුණු කිරීම් | 312 | 70 | - | 382 |
| ගොඩනැගිලි | - | 395 | - | 395 |
| මෝටර් වාහන | 341,902 | 68,405 | (26,879) | 383,428 |
| පරිගණක | 225,553 | 11,818 | - | 237,371 |
| කාර්යාල උපකරණ | 236,914 | 15,811 | (5,663) | 247,062 |
| යටිතල සැපයීම | 11,269,311 | 725,320 | (28,907) | 11,965,724 |
| | **12,073,992** | **821,819** | **(61,449)** | **12,834,362** |
| **තක්සේරුවට** | | | | |
| ගොඩනැගිලි | 14,180 | 14,238 | - | 28,418 |
| | **14,180** | **14,238** | **-** | **28,418** |
| **මුළු ක්ෂය** | **12,088,172** | **836,057** | **(61,449)** | **12,862,780** |

| 3.2.4 ශුද්ධ පොත් අගය | 2013 රු.'000 | 2012 රු.'000 |
|---|---|---|
| **පිරිවැයට** | | |
| කල් බදු ඉඩම් සඳහා වැඩිදියුණු කිරීම් | 2,501 | 2,571 |
| ගොඩනැගිලි | 15,421 | 15,816 |
| මෝටර් වාහන | 247,440 | 260,933 |
| පරිගණක | 39,940 | 33,244 |
| කාර්යාල උපකරණ | 88,071 | 62,484 |
| යටිතල සැපයීම | 7,581,159 | 7,737,387 |
| | **7,974,532** | **8,112,435** |
| **තක්සේරුවට** | | |
| සින්නක්කර ඉඩම් | 1,376,480 | 1,290,021 |
| ගොඩනැගිලි | 548,684 | 553,077 |
| | **1,925,164** | **1,843,098** |
| **කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ** | | |
| යටිතල සැපයීම | 407,877 | 492,299 |
| | **407,877** | **492,299** |
| **දේපල, පිරියත හා උපකරණවල මුළු ශුද්ධ ධාරණ අගය** | **10,307,573** | **10,447,832** |

### 3.3 දේපල, පිරියත හා උපකරණ (සම්බන්ධිතයි)

කේ.ටී.ඩී. තිසේරා, පී.බී.ඩී. එදිරිසිංහ, පී.ටී. මොහිදින් සහ සුනිල් ෆර්නෑන්ඩු ඇන්ඩ් ඇසෝසියේට්ස් යන ස්වාධීන තක්සේරුකරුවන් විසින් 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තුළදී ප්‍රත්‍යාගණනය කිරීමේ අරමුණ සඳහා වෙළෙඳපොල පදනම් සාක්ෂිවලට යොමුව ඉඩම් හා ගොඩනැගිලි අවසාන සාධාරණ අගය තීරණය කරන ලදී. 2011 දෙසැම්බර් 31 දින වන එහි බලපෑම් දිනය සිට මෙම මූල්‍ය ප්‍රකාශනවල එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල ඇතුළත් කරන ලදී. ප්‍රත්‍යාගණනයෙන් පැන නගින අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වූ ප්‍රත්‍යාගණිත වත්කම්වල ධාරණ අගය පහත පරිදි වත්කම් ක්ෂය අඩු පිරිවැයට ධාරණය කරන ලදී.

| වත්කම් පන්තිය | පිරිවැය රු.'000 | වත්කම් පිරිවැයට ධාරණය වූයේ නම් සමුච්චිත ක්ෂය රු.'000 | 2013 වර්ෂයේ ශුද්ධ ධාරණ අගය රු.'000 | පිරිවැය රු.'000 | වත්කම් පිරිවැයට ධාරණය වූයේ නම් සමුච්චිත ක්ෂය රු.'000 | 2012 වර්ෂයේ ශුද්ධ ධාරණ අගය රු.'000 |
|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 317,055 | 84,443 | 232,612 | 317,055 | 76,517 | 240,538 |
| ඉඩම | 502,125 | - | 502,125 | 502,125 | - | 502,125 |
| | **819,180** | **84,443** | **734,737** | **819,180** | **76,517** | **742,663** |

**3.4** මූල්‍ය වර්ෂය තුළදී එකතු වටිනාකම රු. මිලියන 1,472 (2012 – රු. මිලියන 1,157) ක් වූ දේපල, පිරියත හා උපකරණ සමාගම අත්කර ගන්නා ලදී. දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා වර්ෂය තුළදී රු. මිලියන 91 ක් වූ ( 2012 – රු. මිලියන 1,157) මුදල් ගෙවීම් සිදුකරන ලදී.

### 3.5 වත්කම්වල ඵලදායී ජීවකාලය පහත පරිදි වේ.

| | 2013 | 2012 |
|---|---|---|
| ගොඩනැගිලි | 2.5% | 2.5% |
| යටිතල සැපයීම | | |
| පළාත් පාලන ආයතන හා ලංකා විදුලිබල මණ්ඩලයෙන් භාර ගන්නා ලද | | |
| උප පොළවල්, ඉහළ විදුලි රැහැන් හා සේවා රැහැන් | වර්ෂයකට 10% | වර්ෂයකට 10% |
| ලෙකෝ විසින් ඉදිකරන ලද උප පොළවල්, ඉහළ විදුලි රැහැන් සහ සේවා රැහැන් | වර්ෂයකට 4% - 5% | වර්ෂයකට 4% - 5% |
| මෝටර් වාහන | වර්ෂයකට 15% | වර්ෂයකට 15% |
| පරිගණක | වර්ෂයකට 20% | වර්ෂයකට 20% |
| කාර්යාල උපකරණ | වර්ෂයකට 15% | වර්ෂයකට 15% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වර්ෂයකට 25% | වර්ෂයකට 25% |

**3.6** රු. මිලියන 583 ක (2012 – රු. මිලියන 2,646) දළ ධාරණ අගයන් ඇති සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කම් සමාගමේ දේපල පිරියත හා උපකරණවල ඇතුළත් වේ.

| 4. ස්පෘශ්‍ය වත්කම් සමූහය පිරිවැයට | 2013.01.01 දිනට ශේෂය රු.'000 | එකතු කිරීම් රු.'000 | අපහරණයන් | 2013.12.31 දිනට ශේෂය රු.'000 |
|---|---|---|---|---|
| කාර්මික ඥානය (වීනයෙන්) | 27,500 | - | - | 27,500 |
| | **27,500** | **-** | **-** | **27,500** |
| **ක්‍රමක්ෂය** | | | | |
| කාර්මික ඥානය (වීනයෙන්) | 7,333 | 1,833 | - | 9,167 |
| | **7,333** | **1,833** | **-** | **9,167** |
| **ශුද්ධ පොත් අගය** | | | | |
| කාර්මික ඥානය (වීනයෙන්) | **20,167** | | | **18,333** |

## 5. ස්කන්ධ සුරැකුම්පත්වල ආයෝජන (සමාගම) පරිපාලිතයන්හි ආයෝජන

